# සෙන්ට්‍රල් ඩිපොසිටරි සිස්ටම්ස් (පුද්ගලික) සමාගම

මෙම රීති, ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කරන ලද ”CDS Rules” හි පරිවර්තනවක් වේ. එසේ හෙයින් මෙම සිංහල පරිවර්තිත CDS රීති සහ ඉංග්‍රීසි බසින් මුල් පිටපත නිකුත් කරන ලද CDS Rules අතරෙහි යම් ගැටුම්සහගත තත්වයක්/ව්‍යාකූලභාවයක් වේ නම්, ඉංග්‍රීසි බසින් නිකුත් කරන ලද CDS Rules බලාත්මක විය යුතුයි.

(2018 ජනවාරි 24 වන දින තෙක් නිකුත් කරන ලද සංශෝධන අන්තර්ගත වේ)

**රීති**

**2014 ජූලි**

| පටුන | පිටුව |
|---|---|
| හැඳින්වීම | 3 |
| 1 වන කොටස - අර්ථ නිරූපණය | 4 |
| 2 වන කොටස - සහභාගිකරුවන් | 9 |
| 3 වන කොටස - සුරැකුම්පත් | 12 |
| 4 වන කොටස - සේවාදායක ගිණුම් | 13 |
| 5 වන කොටස - මිල දී ගැනීම් සහ අලෙවි කිරීම් වාර්තා කිරීම | 21 |
| 6 වන කොටස - අරමුදල් ගෙවා නිරාකරණය කිරීම සඳහා පහසුකම් සැළැස්වීම | 24 |
| 7 වන කොටස - සුරැකුම්පත් අභෞතිකකරණය | 30 |
| 8 වන කොටස - සුරැකුම්පත් ප්‍රතිභෞතිකකරණය කිරීම | 34 |
| 9 වන කොටස - CDS හි සුරැකුම්පත් පැවරීම | 35 |
| 10 වන කොටස - හිමිකම් | 38 |
| 11 වන කොටස - CDS ගිණුම් ප්‍රකාශ | 42 |
| 12 වන කොටස - අන්තර් සහභාගිකරුවන් අතර ගෙවා නිරාකරණය කිරීම් පැහැරහැරීම පාලනය කරනු ලබන රීති | 47 |
| 13 වන කොටස - පොදු විධිවිධාන | 50 |
| 14 වන කොටස - සහභාගිකරුවන්වන්ගේ මූල්‍ය වගකීම සහ මෙහෙයුම් හැකියාව | 54 |
| 15 වන කොටස - සේවා සඳහා ප්‍රවේශ වීමේ සීමාවන් | 55 |
| 16 වන කොටස - විනය පිළිබඳ කාර්ය පටිපාටි | 56 |
| 17 වන කොටස - කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව (CSE) වෙත (සංශෝධිත) සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 23 වන වගන්තිය ප්‍රකාරව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (SEC) විසින් ලබාදෙන විධානයකින් පසුව අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය පිළිබඳ රීති | 57 |
| 18 වන කොටස - ණය සුරැකුම්පත් වලට අදාල රීති | 60 |

| | | |
|---|---|---|
| 19 වන කොටස - | CSE හි ස්වයංක්‍රීය වෙළඳ ක්‍රමය ම All or None (AON) blocks වශයෙන් සිදු කරනු ලබන වෙළඳාම් නිෂ්කාශනය කිරීම සහ මුදල් ගෙවා නිරාකරණය කිරීම සඳහා වූ අතිරේක රීති | 67 |

# හැඳින්වීම

## සෙන්ට්‍රල් ඩිපොසිටරි සිස්ටම්ස් (පුද්ගලික) සමාගම

කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව (CSE) තුල වෙළඳාම් කරනු ලබන සුරැකුම්පත් සම්බන්ධයෙන් තැන්පතුගාරයක් වශයෙන් ක්‍රියාකිරීමේ කාර්ය සඳහා සහ ඊට අතිරේකව එසේ ගණුදෙනු කරන ලද සුරැකුම්පත් ගෙවා නිරාකරණය කිරීම සඳහා පහසුකම් සැළැස්වීම පිණිස 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ වගකීමෙන් සීමිත පෞද්ගලික සමාගමක් වශයෙන් කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව (CSE) විසින් සම්පූර්ණයෙන්ම සන්තකය දරනු ලබන පාලිත සමාගමක් වන සෙන්ට්‍රල් ඩිපොසිටරි සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය 1991 අගෝස්තු 30 වන දිනයේදී සංස්ථාගත කරන ලදී.

සහභාගිකරුවන් වෙත CDS විසින් පිරිනමනු ලබන තැන්පතුගාර කාර්යයන්වලට අදාළ රීති මෙම රීතිවල නිශ්චිතව දක්වා ඇත.

CDS හි සියලු සහභාගිකරුවන් (Participants) මෙම රීතිවලට අනුකූලව ක්‍රියාකල යුතුය. රීති යම් ආකාරයකින් උල්ලංඝනය කිරීමක්, සහභාගිකරුවකු සහ CDS අතර පවතින ගිවිසුම උල්ලංඝනය කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය. CDS රීති මගින් උපචිත වන වගකීම් ව්‍යවස්ථාපිත වගකීම් සඳහා අතිරේක වශයෙන් සහ ඌනපූරණ වශයෙන් වූ වගකීම් වේ.

## 1 වන කොටස

**අර්ථනිරූපණය**

1. **අර්ථවිග්‍රහයන්**

භාවිත කිරීමේදී, අවස්ථානුකූලව පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස, පහත දැක්වෙන යෙදුම් සඳහා පහත දැක්වෙන අර්ථයන් තිබිය යුතුය.

**ගිණුම්හිමියා**

යන්නෙන් CDS හි සේවාදායක ගිණුමක් දරනු ලබන තැනැත්තකු අදහස් වේ.

**නිදහස් ශේෂය**

යන්නෙන් සේවාදායක ගිණුමක ගණුදෙනු කිරීම සඳහා පවත්වාගෙන යන ආයෝජන කළඹ අදහස් වේ.

**අධ්‍යක්ෂ මණ්ඩලය**

යන්නෙන් CDS අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් වේ.

**CDS**

යන්නෙන් සෙන්ට්‍රල් ඩිපොසිටරි සිස්ටම්ස් (පුද්ගලික) සමාගම) Central Dipository Systems (Pvt) Limited) අදහස් වේ.

**සේවාදායක ගිණුම**

යන්නෙන් මෙම රීතිවල 4 වන රීතිය ප්‍රකාරව CDS හි යම් තැනැත්තකු වෙනුවෙන් විවෘත කරනු ලබන ගිණුමක් අදහස් වේ.

**CSE**

යන්නෙන් කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව අදහස් වේ.

**සමාගම් ලේකම්**

යන්නෙන් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථාපරිදි පත්කරන ලද ලැයිස්තුගත සමාගමක සමාගම් ලේකම්වරයා අදහස් වේ.

**භාරකාර බැංකුව / භාරකාර සහභාගිකරු**

යන්නෙන් භාරකාර සේවය සපයන ලබන්නා වූ (සංශෝධිත) 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී බැංකුවක් අදහස් වේ.

**භාරකාර ගණුදෙනු**

යන්නෙන් CDS හි භාරකාර බැංකුවක් හරහා ලියාපදිංචි වී ඇති යම් ගිණුම් හිමියකු විසින් සිදුකරනු ලබන ගණුදෙනු කිරීමක් අදහස් වේ.

**අභෞතිකකරණය**

යන්නෙන් භෞතික ස්වභාවයෙන් දරනු ලබන කොටස් යම් ගිණුම්හිමියන් විසින් CDS හි ඉලෙක්ට්‍රොනික ආකාරයට වෙනස්කිරීමේ ක්‍රියාවලිය අදහස් වේ.

**නිදහස් නොවූ ශේෂය**

යන්නෙන් අදාළ සුරැකුම්පත් නිකුත්කරන්නාගේ උපදෙස් අනුව ගණුදෙනු කිරීම සීමාකර ඇත්තා වූ මුලික සුරැකුම්පත් නිකුතුවක් හරහා සේවාදාක ගිණුමක තැන්පත් කරනු ලබන සුරැකුම්පත් ආයෝජන අදහස් වේ.

**සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය (ISIN)**

යන්නෙන් ජාත්‍යන්තර තත්ව සංවිධානය විසින් ඇතිකරනු ලැබූ සුරැකුම්පත් හඳුනාගැනීම සඳහා වූ තත්ව වලට අනුකූලව CSE විසින් පවරාදෙනු ලැබූ අනන්‍ය වු අංකයක් අදහස් වේ.

**ලැයිස්තුගත ආයතනය**

යන්නෙන් CSE හි ලැයිස්තුගත කරන ලද සුරැකුම්පත් ඇත්තා වූ යම් ආයතනයක් අදහස් වේ.

**ලැයිස්තුගත සුරැකුම්පත්**

යන්නෙන් CSE හි ලැයිස්තුගත කරන ලද සුරැකුම්පත් අදහස් වේ.

**අවහිරකරන ලද ශේෂය**

යන්නෙන් ගිණුම්හිමියාගේ ඉල්ලීම පරිදි වෙළඳාම් කිරීම අවහිරකර ඇත්තාවූද මෙම රීතිවල 7.1 සහ 8.1 රීතිවල නිශ්චිතව දක්වා ඇති අවස්ථාවලදී හැර, සහභාගිකරු වෙත දෘශ්‍යමාන කරගත නොහැකිවූ ද යම් ගනුදෙනුකාර ගිණුමක දරනු ලබන සුරැකුම්පත් ආයෝජනයක් අදහස් වේ.

**වෙළඳපොළ දිනය**

යන්නෙන් ගණුදෙනු කිරීම සඳහා CSE විවෘතව තබන ලබන යම් දිනයක් අදහස් වේ.

**සාමාජිකයා**

යන්නෙන් CSE හි සාංගමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව CSE හි සාමාජිකයකු හෝ වෙළඳ සාමාජිකයකු වශයෙන් සාමාජිකත්වය පිළිගෙන ඇති යම් සාමාජිකයකු අදහස් වේ.

**NIC (ජා.හැ. පත)**

යන්නෙන් (සංශෝධිත) 1968 අංක 32 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නිකුත්කරන ලද ජාතික හැඳුනුම්පත අදහස් වේ.

**ජාතික හැඳුනුම්පත් ( NIC) අංකය**

යන්නෙන් ජාතික හැඳුනුම්පතෙහි සඳහන්වන අංකය අදහස් වේ.

**ක්‍රියාකාරී නොවන සේවාදායක ගිණුම**

යන්නෙන් අවසානයට පවත්වනු ලැබූ ගනුදෙනු දින සිට වසර තුනක (3) කාලයක් සඳහා කිසිදු ගනුදෙනුවක් සිදු වී නොමැත්තා වූ ද CDS විසින් ගනුදෙනුකිරීමේ කටයුතු අත්හිටුවා ඇත්තාවූද සේවාදායක ගිණුමක් අදහස් වේ.

**සහභාගිකරු**

යන්නෙන් මෙම රීතිවල 2 වන රීතිය යටතේ සහභාගිකරුවකු වශයෙන් CDS විසින් අනුමතකරන ලද යම් සංවිධානයක්, ආයතනයක් හෝ තැනැත්තකු අදහස් වේ.

**ප්‍රතිභෞතිකකරණය කිරීම**

යන්නෙන් CDS හි ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් දරනු ලබන සුරැකුම්පත් හිමිකාරත්වය භෞතිකකරණයට ලක් කිරීම අදහස් වේ.

**රීති**

යන්නෙන් මෙම CDS රීති අදහස් වේ.

**SEC**

යන්නෙන් (සංශෝධිත) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පනත යටතේ පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව අදහස් වේ.

**සුරැකුම්පත්**

යන්නෙන් (සංශෝධිත) 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පනතේ අර්ථනිරූපණය කර ඇත්තාවූ ද යෝග්‍ය සුරැකුම්පත් වශයෙන් කලින්කල CDS විසින් පිළිගෙන ඇත්තා වූ ද සුරැකුම්පත් අදහස් වේ.

**නිරාකරණය කිරීම**

යන්නෙන් මෙම රීතිවල 6 වන රීතිය ප්‍රකාරව මුදල් ගෙවා නිරාකරණය කිරීම අදහස් වේ.

**නිරාකරණයට කිරීමට අපොහොසත් වීම**

යන්නෙන් CDS විසින් කලින්කල නිශ්චය කරනු ලබන අන්තර් සහභාගීත්ව නිරාකරණය කිරීමේ දිනයේදී සහභාගිකරුවකු විසින් මුදල් ගෙවා නිරාකරණය කිරීමට අපොහොසත්වීම අදහස් වේ.

**සුරැකුම්පත් වෙළඳ සහභාගිකරු**

යන්නෙන් සරැකුම්පත් වෙළෙන්දකු (Stock Dealer) වශයෙන් ක්‍රියාකිරීම සඳහා SEC විසින් බලපත්‍ර ප්‍රදානය කරන ලද CSE හි සාමාජිකයකු හෝ වෙළඳ සාමාජිකයකු අදහස් වේ.

**සුරැකුම්පත් තැරැව්කාර සහභාගිකරු**

යන්නෙන් සුරැකුම්පත් තැරැව්කරුවකු වශයෙන් ක්‍රියාකිරීම සඳහා SEC විසින් බලපත්‍ර ප්‍රදානය කරන ලද CSE හි සාමාජිකයකු හෝ වෙළඳ සාමාජිකයකු අදහස් වේ.

**වෙළඳාම් කිරීම (Trade)**

යන්නෙන් CSE හි ස්වයංක්‍රීය වෙළඳ ගනුදෙනු පද්ධතිය හරහා බලාත්මකවන සුරැකුම්පත් මිලදී ගැනීමක් හෝ විකිණීමේ ගනුදෙනුවක් අදහස් වේ.

**ලැයිස්තුගත නොකරන ලද සරැකුම්පත්**

යන්නෙන් CSE හි ලැයිස්තුගත නොකරන ලද සරැකුම්පත් අදහස් වේ.

මෙහි ශීර්ෂපාඨ සඳහන් කිරීමේ පහසුව සඳහා පමණක් සපයනු ලැබ ඇති අතර රීතිවල සඳහන් විධිවිධාන අර්ථනිරූපණය කිරීම සඳහා හෝ එම විධිවිධාන සකස් කිරීම සඳහා එම ශීර්ෂ මගින් බලපෑමක් ඇති නොවිය යුතු ය.

## 2. රීති අර්ථනිරූපණය කිරීම

පටහැණිව ප්‍රකාශිත ලෙස විධිවිධාන සලස්වා ඇත්නම් මිස, මෙම රීති අර්ථනිරූපණය කිරීම ඉහත නිශ්චිතව දක්වා ඇති අර්ථනිරූපණය කිරීම්වලට අනුකූලව සිදු විය යුතු ය. මෙම රීතිවල යම් අර්ථ ව්‍යාකූලභාවයක් ඇති වන අවස්ථාවක දී, CDS හි අධ්‍යක්ෂ මණ්ඩලය හෝ එහි යම් කමිටුවක් වෙත CDS හි රීති අර්ථනිරූපණය කිරීම සඳහා බලය ඇත්තේ ය. අධ්‍යක්ෂ මණ්ඩලය හෝ එහි යම් කමිටුවක් හෝ එහි නාමිකයකු (නාමිකයන්) විසින් කරනු ලබන අර්ථනිරූපණ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව වෙත ඒ පිළිබඳ අභියාචනය කිරීමට යටත්ව අවසානාත්මක විය යුතු මෙන්ම ඒ සමග බැඳී සිටිය යුතු අතර එම අභියාචනා දින 7 ක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

මෙම රීතිවල විධිවිධාන සහ CDS මෙහෙයුම් මාර්ගෝපදේශ සහ කාර්යපටිපාටි අතර යම් ගැටුම්සහගත තත්ත්වයක් ඇතිවන අවස්ථාවක දී, මෙම රීති බලාත්මක විය යුතුය.

## 2 වන කොටස

**සහභාගිකරුවන්**

CDS ගිණුම්හිමියකුට අදාළ සියලු ගනුදෙනු CDS **සහභාගිකරුවන්** හරහා පමණක් සිදුකළ යුතු වේ.

### 2.1 සහභාගිකරුවකු වශයෙන් පත්වීම සඳහාවූ යෝග්‍යතාවය

පහත දැක්වෙන තැනැත්තන් **සහභාගිකරුවකු** වශයෙන් පත්කිරීම සඳහා යෝග්‍ය වන්නේ ය.

(i) කොටස් තැරැව්කරුවන් ;

(ii) කොටස් වෙළෙන්දන් ;

(iii) භාරකාර බැංකු ;

(iv) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වකීය පරම අභිමතය පරිදි තීරණය කරනු ලබන වෙනත් යම් තැනැත්තන්/ආයතන

### 2.2 සහභාගිකරුවකු වශයෙන් පත්කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රය

**සහභාගිකරුවකු** වශයෙන් පත්කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් CDS විසින් කලින්කල නියම කරනු ලබන ආකෘතියට අනුකූලව CDS වෙත ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

### 2.3 සහභාගිකාර තත්ත්වය ප්‍රදානය කිරීම

**සහභාගිකාර** තත්ත්වය ප්‍රදානය කිරීම CDS විසින් කලින් කල තීරණය කරනු ලබන නියම හා කොන්දේසිවලට යටත්ව සිදුවිය යුතු අතර එම නියම හා කොන්දේසි **සහභාගිකාර** තත්ත්වය පිරිනමනු ලබන අවස්ථාවේ දී **සහභාගිකාරු** වෙත ලිඛිතව සන්නිවේදනය කරනු ලැබිය යුතුය.

### 2.4 මෙහෙයුම් මාර්ගෝපදේශ සහ කාර්ය පටිපාටි

පරිපාලනමය කාර්ය සඳහා, CDS විසින් **සහභාගිකාරුවන්** වෙත ලිපි හෝ චක්‍රලේඛ ආකාරයෙන් කලින්කල මෙහෙයුම් මාර්ගෝපදේශ සහ කාර්යපටිපාටි නිකුත්කරනු ලැබිය හැකිය.

## 2.5 සහභාගිකාර කේතය

හඳුනා ගැනීමේ පහසුව සඳහා, CDS විසින් එක් එක් සහභාගිකාරු වෙත සහභාගිකාර කේතයක් පවරා දෙනු ලබන අතර එම සහභාගිකාරු පිළිබඳ සඳහන් කිරීමේදී එම සහභාගිකාර කේතය භාවිත කරනු ලැබිය යුතු ය.

## 2.6 සහභාගිකාරු වෙනුවෙන් ක්‍රියාකිරීම සඳහා බලය පවරන ලද තැනැත්තන්

සෑම එක් එක් සහභාගිකරු විසින්ම තමා වෙනුවෙන් ක්‍රියාකිරීම සඳහා ප්‍රධාන විධායක නිලධරයාගේ අත්සනින් යුතුව පත්කරන ලද බලයලත් තැනැත්තන් පිළිබඳව CDS වෙත නම් කරනු ලැබිය යුතුය. එම සහභාගිකරුවන්ට අදාල කරුණු පිළිබඳව CDS වෙත උපදෙස් ලබාදීම සඳහා එම නාමිකයන් සහභාගිකරුගේ සම්බන්ධීකාරක පුද්ගලයන් විය යුතු අතර ඔවුන්ට ඒ පිළිබඳ අධිකාරී බලය තිබිය යුතු ය. එම බලයලත් තැනැත්තන්ට අදාල යම් වෙනස් කිරීමක්, ඒ සම්බන්ධයෙන් තීරණය කිරීමෙන් පසුව වහාම CDS වෙත ලිඛිතව සන්නිවේදනය කරනු ලබන බවට සහභාගිකරුවන් විසින් සහතික විය යුතුය.

## 2.7 සහභාගිකරුවන්ගේ ගාස්තු

සහභාගිකරුවකු වශයෙන් සාමාන්‍යයෙන් පිළිගනු ලැබීමෙන් පසුව, CDS විසින් කලින්කල නිශ්චිතව දක්වනු ලබන ආකාරයට CDS විසින් පිරිනමනු ලබන සේවා සහ පහසුකම් සම්බන්ධයෙන් එම සහභාගිකරු විසින් ගාස්තු, අය කිරීම් සහ ප්‍රතිපූරණ වියදම් ගෙවනු ලැබිය යුතු ය.

## 2.8 බැංකු ඇපකරය

(ඒ) CDS වෙත පිළිගනු ලැබිය හැකි ආකෘතියකින් සෑම එක් එක් සහභාගිකරුවකු විසින්ම බැංකු ඇපකරයක් ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එම එක් එක් සහභාගිකරු වෙත නියම කරනු ලැබිය හැකි අතර CDS විසින් දරනු ලබන එම බැංකු ඇපකරය මෙම රීතියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට අදාළ කර ගනු ලැබිය යුතුය. එක් එක් සහභාගිකරු විසින් ලබා දීමට නියමිත බැංකු ඇපකර මුදල කලින්කල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට CDS විසින් නියම කරනු ලැබිය යුතුය. මෙම බැංකු ඇපකරය (සංශෝධිත) 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන යටතේ යථාපරිදි වූ බලපත්‍රලාභී ආයතනයකින් ලබා ගත යුතු වේ.

(බී) සහභාගිකරු විසින් ඉදිරිපත් කරනු ලබන බැංකු ඇපකරයක් භාවිත කිරීම පහත සඳහන් අවස්ථා සඳහා සීමා විය යුතු ය.

(i) CDS හි පාඩු හෝ වගකීම් ඉටු කිරීම සඳහා ;

(ii) CDS හි ව්‍යාපාරික කටයුතු මෙහෙයවීමට ආනුෂංගික වන CDS හි පාඩු සහ වගකීම් ඉටු කිරීම සඳහා.

## 3 වන කොටස

### සුරැකුම්පත්

### 3.1 යෝග්‍ය සුරැකුම්පත්

ඒ. ලැයිස්තුගත සුරැකුම්පත්

බී. ලැයිස්තුගත නොකළ සුරැකුම්පත්

සී. සුරැකුම්පත් සහතික නිකුත් කිරීම ඇතුලුව එම ලැයිස්තුවෙන් ඉවත් කිරීම/ ලියාපදිංචිය ඉවත්කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වන ක්‍රමවේද සම්පූර්ණ කරනු ලබන තෙක් CSE විසින් ලැයිස්තුවෙන් ඉවත් කරන ලද සුරැකුම්පත්.

### 3.2 සුරැකුම්පත් අනන්‍යතා අංකය ( Security ID)

සියලු සුරැකුම්පත් සම්බන්ධයෙන් CSE විසින් පවරනු ලබන කොටස් අනන්‍යතා අංකය CDS විසින් භාවිත කරනු ලැබිය යුතු වේ.

### 3.3 සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය (ISIN)

එක් එක් සුරැකුම්පත් කොටස සඳහා CSE විසින් පවරා දෙනු ලබන සුවිශේෂී සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංකය CDS විසින් භාවිත කරනු ලැබිය යුතු ය.

### 3.4 සුරැකුම්පත්වල යෝග්‍යතාවය පිළිගැනීම / අත්හිටුවීම

යම් සුරැකුම්පතක් යෝග්‍ය සුරැකුම්පතක් බවට පත්වන හෝ යෝග්‍ය සුරැකුම්පතක් බවට පත්වීම අවසන් වන දිනය CDS විසින් කොටස් ගනුදෙනුකරු වෙත දැනුම් දිය යුතු ය.

## 4 වන කොටස

### සේවාදායක ගිණුම්

### 4.1 CDS හි සේවාදායක ගිණුම් විවෘත කරනු ලැබිය හැකි පුද්ගලයන්.

යම් සංස්ථාගත හෝ ස්වාභාවික තැනැත්තකු වෙනුවෙන් සහභාගිකරුවන් විසින් සේවාදායක ගිණුම් විවෘත කරනු ලැබිය හැකි අතර තනි පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, එම තැනැත්තා වයස අවුරුදු 18 ක් හෝ ඊට වැඩි විය යුතුය. මෙම රීතියේ කාර්ය සඳහා " සංස්ථාගත සමාගමක්" යන්නට ශ්‍රී ලංකාවේ යථාපරිදි සංස්ථාගත කර ඇති යම් සමාගමක් හෝ සංස්ථාවක් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති යම් සමාගමක්, සංස්ථාවක් හෝ ව්‍යවස්ථාවක් යටතේ යථාපරිදි පිහිටුවනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයක් අදහස් වේ. සේවාදායක ගිණුම් විවෘත කරනු ලබන්නේ යම් තැනැත්තකු වෙනුවෙන්ද එම තැනැත්තන් ගිවිසුම්වලට එළඹීමේ නෛතික හැකියාවක් ඇති තැනැත්තන් බවට සහභාගිකරුවන් විසින් සහතික විය යුතුය.

යම් නීතියක් සහ/හෝ නියෝගයක් යටතේ ව්‍යාපාරික ගනුදෙනු සිදු කිරීම තහණම් කර ඇත්තාවූ යම් සංස්ථාවක්/ස්වාභාවික තැනැත්කු සඳහා සහභාගිකරුවන් විසින් ගිණුම් විවෘත කරනු නොලැබිය යුතු ය.

### 4.2 සේවාදායක ගිණුම් විවෘත කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍ර

කලින්කල අදාල වන්නා වූ (සහභාගිකරුවන් වෙත ලිපි සහ චක්‍රලේඛ ආකාරයෙන් නිකුත් කරනු ලබන) ඉල්ලුම්පත්‍ර ආකෘතියේ සහ CDS මෙහෙයුම් මාර්ගෝපදේශ සහ කාර්ය පටිපාටිවල නියම කර ඇති තොරතුරු ඉල්ලුම්කරුවන් විසින් සපයනු ලැබිය යුතුය.

මෙම රීති හෝ CDS මෙහෙයුම් මාර්ගෝපදේශ හෝ කාර්යපටිපාටි වලට අනුකූල නොවන්නා වූ සෑම ගිණුම් විවෘත කිරීමේ ඉල්ලුම් පත්‍රයක්ම CDS විසින් ක්‍රියාත්මක කරනු නොලැබේ. මේ සම්බන්ධයෙන් CDS හි තීරණය අවසානාත්මක වේ.

යම් ඉල්ලුම්පත්‍රයක සපයා ඇති විස්තරවල තත්‍ය භාවය/අව්‍යාජත්වය පිළිබඳව සැකකිරීම සඳහා CDS වෙත සාධාරණ හේතු ඇති අවස්ථාවක දී, හෝ ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ වී නොමැති අවස්ථාවක දී, නිසි සැලකිල්ලක් දැක්වීමෙන් සහ විමසා බැලීමෙන් පසුව එම ඉල්ලීම නිශ්ප්‍රභා කිරීමේ අයිතිය CDS ආයතනය සතු වේ.

## 4.3 බහු විධ සේවාදායක ගිණුම්

(ඒ) යම් ස්වභාවික තැනැත්තකු වෙත පහත දැක්වෙන ආකාරයට එක් ගිණුමක් හෝ ගිණුම් වැඩි ගණනක් විවෘත කර පවත්වාගෙන යෑම සඳහා අවසර දෙනු ලැබේ.

(i) විවිධ සහභාගිකරුවන් හරහා යම් ස්වභාවික තැනැත්කු විසින් ගිණුම් විවෘත කර පවත්වාගෙන යනු ලැබිය හැකිය. අදාළ සහභාගිකරුගේ සහභාගීවීමේ කේතය සමග එම තැනැත්තා වෙත CDS විසින් අනන්‍ය වු ගිණුම් අංකයක් පවරා දෙනු ලැබේ.

(ii) එකම සහභාගිකරු සමඟ එක් ගිණුමකට වැඩි ගිණුම් විවෘතකර පවත්වාගෙන යෑම සඳහා ස්වාභාවික තැනැත්තකු වෙත අවසර දෙනු නොලැබේ.

(බී) එකම සහභාගිකරුවකු හෝ විවිධ සහභාගිකරුවන් හරහා එක් ගිණුමකට වැඩි ගිණුම් ප්‍රමාණයක් විවෘත කර පවත්වාගෙන යෑම සඳහා සංස්ථාගත සමාගමක් වෙත අවසර දෙනු ලැබේ. සංස්ථාගත සමාගමක් විසින් ගිණුම් විවෘත කරනු ලබන අවස්ථාවක දී, අදාල සහභාගිකරුගේ සහභාගිවීමේ කේතය සමග එම සංස්ථාගත සමාගම වෙත අනන්‍ය වු ගිණුම් අංකයක් පවරා දෙනු ලැබේ.

පහත දැක්වෙන කාර්ය සඳහා එකම සහභාගිකරුවකු සමග යම් සංස්ථාගත සමාගමක් විසින් එක් ගිණුමකට වඩා වැඩි ගිණුම් ප්‍රමාණයක් විවෘත කර පවත්වාගෙන යනු ලැබිය හැකිය; එනම්,

(i) ව්‍යවස්ථාවක් යටතේ / CSE රීති යටතේ නියම කර ඇත්නම්;

(ii) සමාගමේ ආයෝජන වෙන්කර තැබීම සඳහා;

(iii) CDS වෙත පිළිගත හැකි වෙනත් යම් සමාන කාර්යයක් සඳහා.

එසේ වුවද, එවැනි ගිණුම් විවෘත කිරීමේ දී, යම් ප්‍රකාශිත, ව්‍යාංගික හෝ අනුමිත භාරයක් පිළිබඳ නිවේදන CDS විසින් පිළිගනු නොලබන අතර සියලු කාර්ය සඳහා CDS විසින් ගිණුම් ශීර්ෂයේ පළමුව නම සඳහන් වන තැනැත්තා ගිණුමේ ලියාපදිංචි අයිතිකරු වශයෙන් සලකනු ලැබේ.

## 4.4 සේවාදායක ගිණුම් ක්‍රියාත්මක කිරීම

(ඒ) යම් ගිණුම්හිමියෙකු ලියාපදිංචි වී ඇති සහභාගිකරු හරහා පමණක් ගිණුම් හිමියා විසින් CDS වෙත ලබා දිය යුතු සේවාදායක ගිණුමකට අදාළ සියලු උපදෙස් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තවදුරටත් වූ විමසීම්වලින් තොරව CDS විසින් එම උපදෙස් මත ක්‍රියාකරනු ලැබේ.

එම උපදෙස් මත ක්‍රියාකිරීම සඳහා එම උපදෙස්වල ප්‍රමාණවත් විස්තර නොමැති බවට CDS විසින් තීරණය කරන්නේ නම්, එසේ යම් සහභාගිකරුවකු විසින් ලබා දෙන උපදෙස් මත ක්‍රියාකිරීම සඳහා CDS වගකීමට බැඳී නොසිටියි. එසේ වුවද, එසේ නිගමනය කිරීමෙන් පසුව, CDS විසින්, වෙළඳ දින දෙකක් (02) ඇතුළත එම උපදෙස් බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වන අතිරේක විස්තර ලබා දෙන ලෙස එම සහභාගිකරු වෙත දැනුම් දිය යුතු ය.

(බී) සේවාදායක ගිණුම්වලට අදාල යම් වැරදි සහගත හෝ සාවද්‍ය තොරතුරු පිළිබඳ CDS වෙත සන්නිවේදනය කිරීම පිළිබඳව සහභාගිකරු වගකියනු ලැබිය යුතු මෙන්ම වගකීමට යටත්විය යුතු ය.

(සී) සුරැකුම්පත් සහතිකපත් නොමැති ගනුදෙනු සඳහා පහසුකම් සැළැස්වීමේ පරම කාර්ය සඳහා පමණක් ගිණුම්හිමියා සඳහා සහ වෙනුවෙන් යම් සේවාදායක ගිණුමක දරනු ලබන සුරැකුම්පත් CDS විසින් දරනු ලැබිය යුතු ය. CDSට අදාල බැඳීම් සහ වගකීම් මෙම රීතිවල සඳහන් විධිවිධානවලට සීමා විය යුතුය.

(ඩී) යම් සේවාදායක ගිණුමක ගිණුම් ශීර්ෂයේ (හවුල් ගිණුම් හැර) එක් නමකට වැඩි නම් ගණනක් සඳහන්වන අවස්ථාවක දී, CDS වෙත උපදෙස් ලබා ගැනීමේ කාර්ය සඳහා එම ගිණුම් ශීර්ෂයේ පළමුව නම සඳහන්වන තැනැත්තා පමණක් CDS විසින් පිළිගනු ලැබිය යුතුය.

(ඊ) යම් වරදක්/නිවැරදි නොවන කරුණක් අනාවරණය කර ගනු ලැබීමෙන් පසුව ඕනෑම අවස්ථාවක දී යම් සේවාදායක ගිණුමක සඳහන් වැරදි සහගත හෝ නිවැරදි නොවන සඳහන් කිරීමක් නිවැරදි කිරීමේ අයිතිය CDS විසින් තබා ගනු ලැබේ.

(එෆ්) යම් අඩු පාඩු හේතුවෙන් සහභාගිකරුවන් වෙත CDS විසින් ලිපිලේඛන ආපසු යවනු ලබන අවස්ථාවක දී, ලිපිලේඛන ආපසු යොමු කිරීම පිළිබඳ හේතු නිශ්චිතව දක්වමින්, "ආපසු යොමු කිරීමේ ලේඛන පිළිබඳ උපදෙස්' යනුවෙන් සඳහන් කරන ලද ආවරණ ලිපියක් යටතේ එම ලේඛන ආපසු භාරදිය යුතු ය. සහභාගිකරුවන් විසින් එම ලිපිලෙඛණ, නියමිත ලෙස පිළිගැනීමෙන් භාරගත යුතුය.

## 4.5 සේවාදායක ගිණුමක් වෙත කරනු ලබන සුරැකුම්පත් හරකිරීම්/බැරකිරීම්

සේවාදායක ගිණුමක් වෙත පහත දැක්වෙන අවස්ථාවලදී සුරැකුම්පත් බැරකරනු ලැබිය හැකිය.

(ඒ) 5 වන කොටසට අනුව සේවාදායක ගිණුමක් වෙත සුරැකුම්පත් මිල දී ගැනීම.

(බී) 7 වන කොටසට අනුව සේවාදායක ගිණුමක් වෙත බැරකරනු ලබන සුරැකුම්පත් අභෞතිකකරණය /තැන්පත් කිරීම.

(සී) මූලික කොටස් නිකුත් කිරීම, හිමිකම් නිකුත් කිරීම, සංචිත ප්‍රාග්ධනීකරණයක් මාර්ගයෙන් සම්පූර්ණයෙන් ගෙවා නම් වශයෙන් වූ කොටස් අලුතින් නිකුත් කිරීම හෝ 10 වන කොටස ප්‍රකාරව නිකුත් කරනු ලබන වෙනත් යම් කොටස් නිකුත් කිරීමක් අනුව ගිණුම් හිමියෙකු වෙනුවෙන් යම් ලැයිස්තුගත ආයතනයක් විසින් සෘජුවම කරනු ලබන කොටස් තැන්පතු හෝ ලැයිස්තුගත ආයතනයක් විසින් කොටස් උප බෙදීම් කිරීමෙන් පසුව සෘජුවම තැන්පත් කරනු ලබන කොටස්.

(ඩී) 9 වන කොටසට අනුව සේවාදායක ගිණුමක් වෙත සුරැකුම්පත් මාරු කිරීම.

පහත සඳහන් අවස්ථාවලදී සේවාදායක ගිණුමකින් පහත දැක්වෙන සුරැකුම්පත් හර කරනු ලැබිය යුතු ය.

(ඒ) 5 වන කොටස ප්‍රකාරව සේවාදායක ගිණුමකින් සුරැකුම්පත් අලෙවි කිරීම.

(බී) 8 වන කොටස ප්‍රකාරව සේවාදායක ගිණුමකින් සුරැකුම්පත් ප්‍රතිභෞතිකකරණය කිරීම/ආපසු ලබා ගැනීම.

(සී) 9 වන කොටස ප්‍රකාරව එක් සේවාදායක ගිණුමකින් තවත් සේවාදායක ගිණුමක් වෙත සුරැකුම්පත් මාරු කිරීම.

(ඩී) පහත සඳහන් අවස්ථා පිළිබඳව ලැයිස්තුගත සමාගමක් විසින් නිවේදනය කිරීමෙන් පසුව ; එනම්

- 2007 අංක 07 දරන සමාගම් පනත (පනත) යටතේ කොටස් නැවත මිල දී ගැනීම (reourchase of shares) .
- පනත යටතේ ලැයිස්තුගත සමාගමක් විසින් සුලුතරයේ කොටස් මිල දී ගැනීම (minority buyout).
- පනත යටතේ කොටස් නිදහස් කිරීම (redemption of shares).

(ඊ) ලැයිස්තුගත සමාගමක් විසින් කොටස් ඒකාබද්ධ කිරීමෙන් පසුව යම් ගිණුම් හිමියකු වෙනුවෙන් යම් ලැයිස්තුගත සමාගමක් විසින් සුරැකුම්පත් සෘජුවම තැන්පත් කිරීම.

## 4.6 සේවාදායක ගිණුමක් අත්හිටුවීම / වසා දැමීම

### (ඒ) සේවාදායක ගිණුමක් අත්හිටුවීම

පහත දැක්වෙන අවස්ථාවලදී CDS විසින් යම් සේවාදායක ගිණුමක් සම්බන්ධයෙන්වූ ගනුදෙනු අත්හිටුවනු ලැබේ. එනම්,

(i) පහත දැක්වෙන තැනැත්තන් / ආයතන විසින් එසේ ක්‍රියාකරන ලෙස උපදෙස් දෙනු ලැබුවහොත්; එනම්

- සහභාගිකරු හරහා ගිණුම් හිමියා විසින්,
- අධිකරණයක් විසින්,
- SEC විසින්,

(ii) අදාල සහභාගිකරු හරහා යම් ගිණුම් හිමියකුගේ මරණය පිළිබඳව නිසි අධිකාරිය විසින් නිකුත්කරනු ලබන මරණ සහතිකයේ සහතික පිටපතක් ලැබී ඇත්නම් ;

(iii) මෙම රීතිවල 11.2 රීතිය ප්‍රකාරව.

**(බී) සේවාදායක ගිණුමක් වසා දැමීම**

පහත දැක්වෙන අවස්ථාවලදී CDS විසින් සේවාදායක ගිණුමක් වසා දමනු ලැබිය හැකිය:-

- (අවශ්‍ය විය හැකි නියමිත පැහැදිළි කිරීම් ලබා ගැනීමෙන් පසුව) සහභාගිකරු හරහා ගිණුම් හිමියා විසින් එසේ ගිණුම් වසා දමන ලෙස උපදෙස් ලබා දී ඇත්නම් ;
- 4.7 (ඒ)(iii) රීතිය ප්‍රකාරව.

(සී) යම් සේවාදායක ගිණුමක් අත්හිටුවා/වසා දමා ඇති අවස්ථාවක දී, එම සේවාදායක ගිණුම (අවස්ථාවෝචිත පරිදි) අත්හිටුවීම / වසා දැමීම පිළිබඳව සහභාගිකරු මාර්ගයෙන් අදාළ ගිණුම් හිමියා වෙත CDS විසින් යථා පරිදි දැනුම් දිය යුතුය.

## 4.7 ක්‍රියාත්මක නොවන සේවාදායක ගිණුම්

**(ඒ) ආයෝජන ශේෂයක් නොමැති සේවාදායක ගිණුම්**

යම් සේවාදායක ගිණුමක් සම්බන්ධයෙන් වූ අවසාන ගනුදෙනු කටයුත්තේ දින සිට අවුරුදු තුනක (3) කාලයක් සඳහා ආයෝජන ශේෂයක් නොමැතිව යම් සේවාදායක ගිණුමක් ක්‍රියාත්මකව නොපවතින අවස්ථාවක දී, -

(i) CDS විසින් එම ගිණුම ක්‍රියාත්මක නොවන සේවාදායක ගිණුමක් වශයෙන් නම් කරනු ලැබිය යුතු අතර එම ගිණුම අක්‍රිය වීම හේතුවෙන් ක්‍රියාත්මක නොවන

සේවාදායක ගිණුමක් වශයෙන් නම් කර ඇති බවට CDS විසින් අදාල සහභාගිකරු වෙත නිවේදනයක් යවනු ලැබිය යුතු ය.

(ii) ක්‍රියාත්මක නොවන සේවාදායක ගිණුම්වලට අදාලව ගිණුම් හිමියන් වෙත CDS විසින් කිසිදු නිවේදන / ගිණුම් ප්‍රකාශ යවනු නොලැබිය යුතු ය.

(iii) එම ගිණුම ක්‍රියාත්මක නොවන සේවාදායක ගිණුමක් වශයෙන් නම් කිරීමේ දින සිට මාස හයක (6) කාලසීමාවක් අවසන් වීමෙන් පසුව, CDS විසින් ස්වකීය පරම අභිමතය පරිදි එම ක්‍රියාත්මක නොවන සේවාදායක ගිණුම වසා දමනු ලැබේ.

(iv) එවැනි ගිණුමක් ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා යම් ගිණුම් හිමියකුට අවශ්‍ය වන අවස්ථාවකදී, එම ගිණුම් හිමියා විසින් අදාල සහභාගිකරු මාර්ගයෙන් අලුත් ගිණුම් විවෘත කිරීමේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම ඉල්ලීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ "ඔබගේ සේවාදායකයා අවබෝධ කර ගැනීම" (KYC) පිළිබඳ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

**(බී) ආයෝජන ශේෂයක් ඇති සේවාදායක ගිණුම්**

යම් සේවාදායක ගිණුමක් සම්බන්ධයෙන් වූ අවසාන ගනුදෙනු කටයුත්තේ දින සිට අවුරුදු තුනක (3) කාලයක් සඳහා ආයෝජන ශේෂයක් සහිත යම් සේවාදායක ගිණුමක් ක්‍රියාත්මකව නොපවතින අවස්ථාවක දී ,

(i) එම ගිණුම අක්‍රියවීම හේතුවෙන් ක්‍රියාත්මක නොවන සේවාදායක ගිණුමක් වශයෙන් නම් කිරීමට CDS විසින් අදහස් කරගෙන සිටින බවට දැනුම් දෙමින් අදාල සහභාගිකරු වෙත CDS විසින් මූලික නිවේදනයක් යවනු ලැබිය යුතු ය.

(ii) එම ගිණුම අක්‍රියවීම හේතුවෙන් ක්‍රියාත්මක නොවන සේවාදායක ගිණුමක් වශයෙන් නම් කර ඇති බවට CDS විසින් අදහස් කර සිටිනු ලබන බවට දැනුම් දෙමින් අදාල කොටස් ගනුදෙනුකරු වෙත CDS විසින් ආරම්භක නිවේදනයක් යවනු ලැබිය යුතු ය.

(iii) ආරම්භක නිවේදනයේ සඳහන් දින සිට මාස තුනක (3) කාලයක් අවසන් වීමෙන් පසුව, CDS විසින් එම ගිණුම ක්‍රියාත්මක නොවන සේවාදායක ගිණුමක් වශයෙන් නම් කරනු ලැබිය යුතු ය.

(iv) ක්‍රියාත්මක නොවන සේවාදායක ගිණුම්වලට අදාල ගිණුම් හිමියන් වෙත CDS විසින් කිසිදු නිවේදන / ගිණුම් ප්‍රකාශ යවනු නොලැබිය යුතු ය.

(v) ස්වකීය ක්‍රියාත්මක නොවන එවැනි යම් සේවාදායක ගිණුමක් ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා යම් ගිණුම් හිමියකුට අවශ්‍ය වන අවස්ථාවක දී, එම ගිණුම් හිමියා විසින් අදාල සහභාගිකරු මාර්ගයෙන් අලුත් ගිණුම් විවෘත කිරීමේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම ඉල්ලීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ "ඔබගේ සේවාදායකයා අවබෝධ කර ගැනීම" (KYC) පිළිබඳ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

## 5 වන කොටස

### මිල දී ගැනීම් සහ අලෙවි කිරීම් වාර්තා කිරීම

### 5.1 සුරැකුම්පත් මිල දී ගැනීම / විකිණීම

CSE හි ස්වයංක්‍රීය වෙළඳ ක්‍රමය හරහා සහභාගිකරුවන් විසින් සිදු කරනු ලබන වෙළඳ ගණුදෙනු වලට අනුව සේවාදායක ගිණුම් සඳහා කොටස් හර කිරීම හෝ බැර කිරීම සිදු වේ.

ඉහතකී ආකාරයට සිදු කරනු ලබන වෙළඳ ගණුදෙනු වලට ප්‍රතිඵලයක් වශයෙන් සිදු වන සියලු කොටස් හර කිරීම් / බැර කිරීම් වලංගු ගණුදෙනු කටයුතු වශයෙන් සලකනු ලැබේ. එම වෙළඳ ගණුදෙනු වලට සම්බන්ධයෙන් CSE විසින් සපයනු ලබන තොරතුරු පිළිබඳව CDS විසින් පරම වශයෙන් විශ්වාසය තබනු ලැබේ.

ගිණුම් හිමියා සඳහා සහ වෙනුවෙන් සහභාගිකරු විසින් සිදු කරනු ලබන වෙළඳ ගණුදෙනු වලට සම්බන්ධයෙන් ගිණුම් හිමියා සහ සහභාගිකරු අතර පැනනගින කිසිදු ආරවුලක් පිළිබඳව CDS විසින් වගකියනු නොලැබේ.

### 5.2 කොටස් මාරු කිරීම සහ ලියාපදිංචි කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 86(2) වගන්තිය ප්‍රකාරව, CDS විසින් යම්භාරයක් දරනු ලබන ලැයිස්තුගත සමාගමක කොටස් සම්බන්ධයෙන් කොටස් රෙජිස්ටරයෙහි භාර නිවේදනයක් ඇතුලත් කර ඇති අවස්ථාවකදී, එම තැනැත්තා වෙනුවෙන් එම භාරය දන්නේද එම තැනැත්තා -

(ඒ) සමාගමේ කොටස් හිමියකු ලෙස සලකනු ලැබිය යුතු ය, තවද,

(බී) එම කොටස් සම්බන්ධයෙන් කොටස්හිමියා වශයෙන් ස්වකීය නම කොටස් නාමලේඛනයෙහි ඇතුළත් වී ඇති ලෙස සලකා 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යම්තාක් වූ සියලු වගකීම් සහ බැඳීම්වලට යටත්ව එම කොටස්වලට අදාල සියලු අයිතිවාසිකම් සහ වරප්‍රසාද භුක්තිවිඳිනු ලැබිය යුතු අතර, යම්තාක් වූ සියලු අයිතිවාසිකම් වලට හා බැඳීම් වලට යටත් විය යුතු ය.

### 5.3 වටිනාකම රුපියල් මිලියන 20ක් හෝ ඊට වැඩි කොටස් මිලදී ගැනීම

(ඒ) යම් නිශ්චිත වෙළඳපොළ දිනයක් තුලදී යම් සුරැකුම්පතකට අදාලව නිශ්චිත සේවාදායකයකු වෙනුවෙන් යම් සහභාගිකරුවකු (භාරකාර බැංකු හැර)විසින් සිදුකරනු ලබන සියලු මිලදීගැනීම්වල සමස්ථ වටිනාකම රුපියල් මිලියන 20 කට සමාන වේ නම් හෝ එම මුදල ඉක්මවා යන්නේ නම්, එම සහභාගිකරු විසින් CDS වෙත "නිශ්කාශනය කරන ලද අරමුදල්" ස්වභාවයෙන් හෝ CDS නමින්වූ බැංකු ඇපකරයක් ආකාරයෙන් එසේ මිලදී ගනු ලැබූ සුරැකුම්පත්වල සම්පූර්ණ එකතුවෙන් අවම වශයෙන් 15% ක ආන්තිකයක් (margin) වෙළඳ ගණුදෙනු දිනය + 1 දිනයේ (T + 1) පැය 9.00 වේලාවේදී CDS වෙත සපයනු ලැබිය යුතු වේ.

(බී) සහභාගිකරුවන් විසින් එම ආන්තික ගෙවා නරාකරණය කිරීමේ බැංකුවක (Settlement Bank) CDS විසින් පවත්වාගෙන යනු ලබන "ආන්තික තැන්පතු ගිණුම" යනුවෙන් සඳහන් කරනු ලබන වෙනම ගිණුමක් වෙතතැන්පත් කරනු ලැබිය යුතුය. සහභාගිකරුගේ උපදෙස්වලට අනුව CDS විසින් ගෙවා නිරාකරණය කිරීම සඳහා පහසුකම් සැළසීමේ කාර්ය සඳහා පමණක් එම මුදල් ආන්තික භාවිත කරනු ලැබිය යුතු ය. ගෙවා නිරාකරණය කිරීම් පැහැරහරිනු ලබන අවස්ථාවක දී, ගෙවා නිරාකරණය කිරීම සඳහා පහසුකම් සැලැස්වීම පිණිස CDS විසින් මුදල් ආන්තිකය භාවිත කරනු ලැබිය යුතු ය.

(සී) විකල්පයක් වශයෙන්, CDS වෙනුවෙන් ගිණුම්හිමියා විසින් ලබා ගත් සහ CDS වෙත පිළිගත හැකි ආකෘතියෙන් වූ බැංකු ඇපකරයක් සහභාගිකරුවන් විසින් සපයනු ලැබිය හැකිය. ගෙවා නිරාකරණය කිරීම් පැහැර හැරීමේදී පමණක් CDS විසින් බැංකු ඇපකරය බලාත්මක කරනු ලැබිය යුතු ය.

(ඩී) නියමිත ආන්තිකය සැපයීම සඳහා සහභාගිකරු අපොහොසත් වන අවස්ථාවක දී, SEC හි අදහස් විමසා CDS විසින් අවශ්‍ය බවට සලකනු ලබන පියවර ගැනීම සඳහා CDS වෙත හිමිකමක් තිබිය යුතු ය. ඉහත පරිදි පියවර ගැනීම, CDS සහ CSE රීති අනුව සහභාගිකරු සතු වගකීම් වලින් නිදහස්වීමක් සිදුනොවේ.

(ඊ) භාරකාර බැංකුවක් විසින් වෙළඳ ගණුදෙනුවක් තහවුරුකර නොමැති අවස්ථාවක දී, වෙළඳ ගණුදෙනු දිනය + 2 (T+2) දිනයේ 9.00 පැය වන විට සහභාගිකරු විසින් ආන්තිකය ඉදිරිපත් කිරීමට නියමිත වේ.

මේ රීතිවල කාර්ය සඳහා :-

"නිශ්කාශනය වූ අරමුදල්" යන්නෙන් නිශ්කාශනය වී ඇති සහ ආපසු ලබා ගැනීම සඳහා පවතින අරමුදල් අදහස් වේ.

"වෙළඳ ගණුදෙනුව තහවුරුවීම" යන්නෙන් වෙළඳ ගණුදෙනු කිරීමේ දිනය + 1 දිනයේ එනම් T+1 දිනයේ 14.30 පැය වන විට භාරකාර බැංකුව හරහා ලියාපදිංචි වී ඇති සේවාදායකයකු වෙනුවෙන් කොටස් තැරැව්කාර ගනුදෙනුකරු විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙළඳාමක් භාරකාර බැංකුවක් විසින් පිළිගැනීමක් අදහස් වේ.

## 6 වන කොටස

## අරමුදල් ගෙවා නිරාකරණය කිරීම සඳහා පහසුකම් සැළැස්වීම

### 6.1 ගෙවා නිරාකරණය කිරීමේ බැංකුව/බැංකු පත්කිරීම

CSE හරහා සහභාගිකරුවන් විසින් සිදු කරනු ලබන වෙළඳ කටයුතු පිළිබඳ අරමුදල් ගෙවා නිමකිරීම සඳහා පහසුකම් සැළැස්වීමේ අරමුණින් [අන්තර් සහභාගිකරු ගෙවීම් නිරාකරණය කිරීම] (inter-participant settlement), ගෙවා නිරාකරණය කිරීමේ බැංකුව/බැංකු වශයෙන් ක්‍රියාත්මක වීම සඳහා CDS විසින් (සංශෝධිත) 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී එක් වාණිජ බැංකුවක් හෝ වාණිජ බැංකු වැඩි ගණනක් පත්කරනු ලැබිය යුතුය. අන්තර් සහභාගිකරුවන්ගේ අරමුදල් ගෙවා නිරාකරණය කිරීම පහසුකිරීමේ කාර්ය සඳහා එම ගෙවා නිරාකරණය කිරීමේ බැංකුවලින් එක් බැංකුවක් සමග සහභාගිකරුවකු විසින් එක් ගිණුමක් පමණක් විවෘත කරනු ලැබිය යුතු ය.

### 6.2 අන්තර් සහභාගීත්ව ගෙවා නිරාකරණය කිරීම් (Inter-Participant Settlement)

(ඒ) CSE මත වෙළඳාම් කරනු ලබන සුරැකුම්පත් සඳහා කරනු ලබන අන්තර් - සහභාගීත්ව අරමුදල් ගෙවා නිරාකරණය කිරීම, CDS විසින් නිකුත් කරනු ලබන ගෙවා නිරාකරණය කිරීමේ උපලේඛනවලට (Settlement Schedule) අනුව ගෙවා නිරාකරණය කිරීමේ බැංකුව/බැංකු හරහා ගෙවා නිරාකරණය කිරීමේ දිනය වශයෙන් එහි සඳහන් වන්නා වූ වෙළඳාම් කිරීමේ දිනයෙන් පසුව වූ තුන්වන වෙළඳ දිනයේ (T+3) 10.30 පැය වන විට සිදු කරනු ලැබිය යුතු ය. අන්තර් සහභාගිකරු ගෙවා නිරාකරණය කිරීම්, ගෙවා නිරාකරණය කිරීමේ දින (Settlement Date) 10.30 පැය වන විට සම්පූර්ණ කරනු ලැබිය යුතුය.

(බී) මෙම රීති ප්‍රකාරව ගෙවිය යුතු සහ ලැබිය යුතු මුදල් CDS විසින් CDS සඳහා සහ සහභාගිකරුවන් සඳහා හරකිරීම හෝ බැර කිරීම සිදු කළ යුතු වේ.

(සී) සහභාගිකරුගේ ගිණුමට ඇතුලත් කර ඇත්තා වූ හර කිරීම් සහ බැර කිරීම් පෙන්නුම් කරනු ලබන සහ යම් නිශ්චිත ගෙවා නිම කිරීමේ දිනයකදී එක් එක් සහභාගිකරු විසින් ගෙවා නිරාකරණය කළ යුතු ශුද්ධ මුදල පෙන්නුම් කරනු ලබන ගෙවා නිරාකරණය කිරීමේ උපලේඛනයක් සෑම එක් එක් වෙළඳ දිනයකදීම CDS විසින් නිකුත්කරනු ලැබිය යුතු ය.

(ඩී) කොටස් මිලදී ගැනීම සඳහා, ගෙවා නිරාකරණය කිරීමේ දිනයේ 09.00 පැය වන විට මිලදී ගැනීමේ කොටස් තැරැව්කාර ගනුදෙනුකරු / භාරකාර බැංකුව වෙත " නිශ්කාශනය වූ අරමුදල්" පවතින බවට මිලදී ගන්නා විසින් සහතික විය යුතු ය.

(ඊ) CDS විසින් නිකුත් කරනු ලබන ගෙවා නිම කිරීමේ උපලේඛනය මත පදනම්ව එම කොටස් තැරැව්කාර සහභාගිකරුවන් විසින් පවත්වාගෙන යනු ලබන ගනුදෙනු තුලින් උපචිත වන ගෙවීම් නිරාකරණය කිරීම සඳහා ගෙවා නිරාකරණය කිරීමේ දින 09.30 පැය වන විට ගෙවා නිම කිරීමේ බැංකු ගිණුමේ ප්‍රමාණවත් නිශ්කාශනය වූ අරමුදල් පවතින බවට කොටස් අදාල තැරැව්කාර සහභාගිකරු සහතික විය යුතු ය.

(එෆ්) CDS විසින් නිකුත් කරනු ලබන ගෙවා නිම කිරීමේ උපලේඛනය මත පදනම්ව භාරකාර බැංකු විසින් පවත්වාගෙන යනු ලබන ගනුදෙනු තුලින් උපචිත වන ගෙවීම් නිරාකරණය කිරීම සඳහා ගෙවා නිරාකරණය කිරීමේ දිනයේ 09.30 පැය වන විට භාරකාර බැංකු විසින් ගෙවා නිරාකරණය කිරීමේ බැංකු වෙත ප්‍රමාණවත් නිශ්කාශනය වූ අරමුදල් පැවතීමට කටයුතු සැලැස්විය යුතු ය.

මෙම රීතියේ "නිශ්කාශනය වූ අරමුදල්" යන්නෙන් නිශ්කාශනය වී ඇත්තාවූ ද පිළිවෙලින්වූ ගෙවා නිරාකරණය කිරීමේ බැංකුවේ ආපසු ලබා ගැනීම සඳහා පවතින අරමුදල් අදහස් වේ.

### 6.3 භාරකාර බැංකු විසින් ගණුදෙනු තහවුරු කිරීම්/නිශ්ප්‍රභා කිරීම්

CDS හි භාරකාර බැංකුවක් හරහා ලියාපදිංචි වී ඇති ගිණුම් හිමියන් වෙනුවෙන් සිදු කරනු ලබන ගණුදෙනු, කලින්කල CDS විසින් නියම කරනු ලබන ආකෘතියෙන් වෙළඳාම් කිරීමේ දිනය එකතුව ඊ ළඟ දිනයේදී (T+1) 14.30 පැය වන විට පිළිවෙලින් වූ භාරකාර බැංකුව විසින් තහවුරු කිරීම හෝ නිෂ්ප්‍රභා කිරීම කරනු ලැබිය යුතු වේ.

ඕනෑම හේතුවක් නිසා මෙම රීතියේ සඳහන් නිශ්චිත කාලසීමාවට පෙරාතුව කොටස් තැරැව්කාර ගනුදෙනුකරුවකු විසින් සිදු කරනු ලබන ගණුදෙනුවක් තහවුරු කිරීමට භාරකාර බැංකුව අපොහොසත්වන අවස්ථාවක දී, එම තහවුරු කිරීමට අපොහොසත් වීම භාරකාර බැංකුව විසින් ගණුදෙනු නිෂ්ප්‍රභා කිරීමක් වශයෙන් සලකනු ලැබිය යුතුය.

භාරකාර බැංකුවක් විසින් වෙළඳාම් කිරීමේ දිනය එකතුව දින 1 ක් සඳහා ( T+1) ගණුදෙනු නිෂ්ප්‍රභා කිරීමක් සිදු වන අවස්ථාවක දී, එම භාරකාර බැංකුව වෙනුවට CDS විසින් අරමුදල් ගෙවා නිරාකරණය කිරීමේ කාර්ය සඳහා ගණුදෙනු සිදුකරන ලද කොටස් තැරැව්කාර සහභාගිකරුවකු ආදේශ කරනු ලැබිය යුතු ය. එම ගණුදෙනුව කරනු ලැබූ කොටස් තැරැව්කාර සහභාගිකරු විසින් එම ගණුදෙනුව නිරාකරණය කිරීම සඳහා වගකියනු ලැබිය යුතු ය.

කෙසේ වුවද AON Block පහසුකමක් භාවිත කරමින් CSE හි ස්වයංක්‍රීය වෙළඳ ක්‍රමය මත සිදු කරනු ලබන වෙළඳාම් සම්බන්ධයෙන් T+1 දින පැය 14.30 වන විට වෙළඳාමක් ස්ථිර කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට භාරකාර බැංකුවක් වෙත පනවා තිබූ ඉහත කී නියමය අදාළ නොවේ.

### 6.4 මිලදී ගන්නා විසින් ගෙවීම් පැහැර හැරීම

CSE හි ස්වංක්‍රිය වෙළඳ ක්‍රමය මත AON Block වශයෙන් ක්‍රියාත්මක කරනු ලබන වෙළඳාම් සම්බන්ධයෙන් මෙම 6.4 රීතිය අදාළ නොවේ.

#### (ඒ) ගෙවීම් පැහැරහැර ඇති සුරැකුම්පත් විකිණීම

ගෙවා නිරාකරණය කිරීමේ දිනයේ දී හෝ එදිනට පෙර මිලදී ගන්නා විසින් ගෙවීම් කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවක දී, මිල දී ගැනීමේ තැරැව්කාර සහභාගිකරු විසින් ස්වකීය පරම අභිමතය පරිදි T+3 වන්නා වූ ගෙවා නිරාකරණය කිරීමේ දිනයෙන් පසුව ඕනෑම දිනයක දී ගෙවීම් පැහැරහැර ඇත්තා වූ සුරැකුම්පත් විකුණනු ලැබිය හැකිය.

එසේවුවද, ගෙවීම් පැහැරහැර ඇති මිලදී ගැනුම්කරු භාරකාර බැංකුවක් හරහා ලියාපදිංචි වී ඇති අවස්ථාවක දී සහ මෙම රීතිවල 6.3 රීතිය ප්‍රකාරව භාරකාර බැංකුව විසින් වෙළඳාම් කිරීම තහවුරු කර ඇති අවස්ථාවක දී කොටස් තැරැව්කාර සහභාගිකරු විසින් අදාල භාරකාර බැංකුවෙන් විකිණීමේ උපදෙස් ලැබීමෙන් පසුව එකී සුරැකුම්පත් අලෙවි කරනු ලැබිය යුතුය.

(ඞ) ගෙවා නිරාකරණය කිරීමේ දිනයේ (T+3) දී මිලදී ගැනීමේ කොටස් තැරැව්කාර සහභාගිකරුගේ ගෙවා නිරාකරණය කිරීමේ වගකීම් ඉටුකිරීමේ අරමුණින් ගෙවීම් පැහැරහැර ඇති මිලදී ගැනුම්කරුවකුට අදාල සුරැකුම්පත් මාරු කිරීම

ගෙවා නිරාකරණය කිරීමේ දිනයේදී මිලදී ගැනීමේ කොටස් තැරැව්කාර සහභාගිකරුගේ ගෙවා නිරාකරණය කිරීමේ වගකීම් සපුරාලීමේ අරමුණින්, (සංශෝධිත) 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් කඩිනම් බැර පහසුකමක් ලබා ගැනීම සඳහා මිල දී ගැනීමේ කොටස් තැරැව්කාර සහභාගිකරුට අවශ්‍ය වන අවස්ථාවක දී :-

(i) ගෙවා නිරාකරණය කිරීමේ දිනයේ 09.00 පැය වන විට මිල දී ගැනීමේ කොටස් තැරැව්කාර සහභාගිකරු විසින් එම මිලදී ගැනුම්කරුගේ ගෙවීම් පැහැරහැරීම පිළිබඳ CDS වෙත දැනුම් දිය යුතු අතර අදාල CDS ආකෘතිය/ආකෘති ඉදිරිපත් කරමින් ගෙවීම් පැහැරහැරීම සම්බන්ධයෙන් වූ සුරැකුම්පත් මිලදී ගැනීමේ සේවාදායක ගිණුමේ සිට කොටස් තැරැව්කාර සහභාගිකරුගේ නම්කල CDS ගිණුමක් වෙත මාරු කරන ලෙස CDS වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

(ii) ඉන්පසුව CDS විසින් එම ගෙවීම් පැහැරහැර ඇති සුරැකුම්පත් :-

- මිලදී ගත් ගැනුම්කරුගේ සේවාදායක ගිණුමකින් මිලදී ගැනීමේ කොටස් තැරැව්කාර සහභාගිකරුගේ නම් කළ CDS ගිණුමක් වෙත; සහ

- කඩිනම් බැර පහසුකමක් ලබා ගැනීම සඳහා කොටස් තැරැව්කාර සහභාගිකරුට හැකිවන පරිදි මිල දී ගැනීමේ කොටස් තැරැව්කාර සහභාගිකරුගේ නම් කළ CDS ගිණුමකින් වාණිජ බැංකුවේ නම් කළ CDS ගිණුමක් වෙත ;

මාරු කරනු ලැබිය හැකිය.

(සී) බැංකුව විසින් දීර්ඝ කරන ලද බැරකම් එම වෙළඳාමේ සම්පූර්ණ වටිනාකම ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී, එම පැහැරහැරීමේ සේවාදායක වෙත අයත්වන ගෙවා නිමි වෙනත් කොටස්, මිලදී ගැනීමේ කොටස් තැරැව්කාර සහභාගිකරු විසින් ඇපයට තබනු ලැබිය යුත්තේ පහත කරුණු වලට යටත්වය;

(i) ගෙවා නිමකර ඇති සහ එකම පැහැරහැරීමේ සේවාදායක වෙත අයත්වන වෙනත් කොටස් ඇපයට තැබීම සඳහා මිලදී ගැනීමේ කොටස් තැරැව්කාර සහභාගිකරුට හැකියාව ලැබෙන පරිදි මිලදී ගැනීමේ කොටස් තැරැව්කාර සහභාගිකරු සහ මිලදීගන්නා අතර ගිවිසුමකට ඇතුළත්ව තිබීම ;

(ii) පැහැරහැරීමේ සේවාදායක විමසීමෙන් පසුව පමණක් එම කොටස් ඇපයට තැබීම ;

(iii) සේවාදායකගේ යහපත උදෙසා මිළදී ගැනීමේ කොටස් තැරැව්කාර සහභාගිකරු නිසි සැලකිල්ලක් සහ උද්යෝගයක් දක්වනු ලැබිය යුතු සහ ඒ සම්බන්ධයෙන් නිතරම ක්‍රියාකරනු ලැබිය යුතුය ;

(iv) ඇපයට තැබීම 6.5 (බී) රීතියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට සිදුවිය යුතු ය.

(ඩී) (සංශෝධිත) 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමග එම සුරැකුම්පත් ඇපයට තැබීමේ පරම කාර්ය සඳහා පමණක්

ඉහත 6.5(බී) සහ 6.5(සී) රීතියේ සඳහන් පරිදි මිලදී ගැනීමේ කොටස් තැරැව්කාර සහභාගිකරුගේ නම් කළ CDS ගිණුම වෙත මාරු කරන ලද සුරැකුම්පත්, මිලදී ගැනීමේ කොටස් තැරැව්කාර සහභාගිකරු විසින් භාවිත කරනු ලැබිය යුතුය.

(ඊ) CDS විසින් කඩිනම් පදනම මත මෙම රීතියේ සඳහන් සියලු පැවරීම් SEC වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(එෆ්) සුරැකුම්පත් විකිණීමෙන් පසුව උපචිතවන පාඩු සහ මෙම රීති ප්‍රකාරව දරනු ලබන සියලු පිරිවැය සහ වියදම් පැහැරහැරීම් සිදු කළ මිලදී ගන්නා විසින් දරනු ලැබිය යුතු ය.

මෙම රීතියේ කාර්ය සඳහා "මිලදී ගන්නා විසින් කරනු ලබන පැහැරහැරීමක්" යන්නෙන් කොටස් මිලදී ගැනීම සඳහා මේ රීතිවල 6.2 රීතිය ප්‍රකාරව කොටස් මිලදී ගැනීමේ කොටස් තැරැව්කාර සහභාගිකරු/භාරකාර බැංකුව වෙත "නිශ්කාශනය වූ අරමුදල්" ලබා දීමට මිලදී ගන්නා විසින් පැහැරහැරීම අදහස් වේ.

## 6.5 ගෙවා නිරාකරණය පැහැරහැරීම

ගෙවා නිමකිරීම් පැහැරහැරීම පාලනය කරනු ලබන රීති මෙම රීතිවල 12 වන කොටසේ දක්වා ඇත.

## 7 වන කොටස

**සුරැකුම්පත් අභෞතිකකරණය**

**(සුරැකුම්පත් තැන්පත් කිරීම)**

### 7.1 සුරැකුම්පත් අභෞතිකකරණය කිරීමේ කාර්ය පටිපාටිය

(ඒ) මෙම රීතිවලට යටත්ව, ගිණුම් හිමියන් විසින් ස්වකීය සුරැකුම්පත් සහතිකපත් හෝ හිමිකම් සාක්ෂි ස්වකීය සේවාදායක ගිණුම් වෙත තැන්පත් කිරීම මගින් (භෞතික ස්වභාවයෙන් දරනු ලබන) සුරැකුම්පත් අභෞතිකකරණය කරනු ලැබිය හැකිය. එම තැන්පත් කිරීම් අදාල සහභාගිකරු හරහා සිදුකළ යුතු ය.

තැන්පත් කිරීම සඳහා CDS වෙත භාර දී ඇති සුරැකුම්පත් සහතික හෝ හිමිකම් සාක්ෂි සහ අදාල CDS ආකෘති පත්‍රය/ආකෘති පත්‍ර, පිටපත් දෙකකින් යුතුව තැන්පත් කිරීම් පිළිබඳ පිළිගැනීමක් කුවිතාන්සිය සමග භාරදී ඇති බවට සහභාගිකරු විසින් සහතික විය යුතුය. තැන්පත් කිරීම් පිළිබඳ ඉල්ලීම ලැබීම තහවුරු කිරීමක් වශයෙන් CDS විසින් සහභාගිකරු වෙත එම අදාල දෙවන පිටපත් ආපසු භාරදෙනු ලැබිය යුතුය. සහභාගිකරුවන් විසින් තැන්පතු පත්‍රිකාවේ එම දෙවන පිටපත ලැබීමේ දින සිට වෙළඳ දින තුනක් (3) ඇතුලත අදාල ගිණුම් හිමියා වෙත එම පිටපත භාරදිය යුතු ය.

(බී) ගිණුම් හිමියකු විසින් සේවාදායක ගිණුමක් වෙත තැන්පත් කිරීමට නියමිත සුරැකුම්පත් සහතික හෝ හිමිකම් පිළිබඳ සාධක යථා පරිදි සම්පූර්ණ කරන ලද, පිටසන් යොදන ලද සහ ලියා අත්සන් කරන ලද අදාල CDS ආකෘතිපත්‍රය/ආකෘතිපත්‍ර සමග ඉදිරිපත්කර ඇති බවට සහභාගිකරුවන් විසින් සහතික විය යුතු ය. එම ආකෘතිපත්‍රයේ/ආකෘතිපත්‍රවල ලබා දී ඇති විස්තර සඳහා කරනු ලබන යම් වෙනස් කිරීම් ගිණුම් හිමියා විසින් යථාපරිදි සහතික කර සහභාගිකරු විසින් අනුඅත්සන් කරනු ලැබිය යුතු ය.

(සී) වැරදි සහගත ලෙස සම්පූර්ණ කරන ලද, පිටසන් යොදන ලද හෝ ලියා අත්සන් කරන ලද කිසිදු ලේඛනයක් මත ක්‍රියාකිරීම සඳහා CDS වගකීමට බැඳී නොසිටියි.

(ඩී) තැන්පත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද සුරැකුම්පත් සහතික හෝ හිමිකම් සාක්ෂිවල සඳහන් සුරැකුම්පත් ප්‍රමාණය, මෙම රීතිවලට යටත්ව අදාල සේවාදායක ගිණුම වෙත තැන්පත් කරනු ලැබිය යුතු ය.

(ඊ) එම සුරැකුම්පත් ප්‍රමාණය CDS හි සේවාදායක ගිණුම වෙත තැන්පත් කිරීමෙන් පසුව, CDS විසින් එම තැන්පත් කිරීමේ දිනයේදී, සමාගම් කොටස් රෙජිස්ටරයේ CDS නමින් එකී සුරැකුම්පත් ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා එම සුරැකුම්පත් වලට අදාල ලැයිස්තුගත සමාගමේ අදාල සමාගම් ලේකම්වරයා වෙත දැනුම් දිය යුතු ය. CDS වෙතින් අදාල ලේඛන ලබා ගැනීම සඳහා කටයුතු සැලැස්වීම සමාගම් ලේකම්වරයාගේ වගකීම වන්නේ ය.

(එෆ්) සුරැකුම්පත් සහතික/හිමිකම් සාක්ෂි අව්‍යාජ ඒවා නොවන බවට ලැයිස්තුගත සමාගම විසින් අදහස් කර සිටිනු ලබන අවස්ථාවක දී, ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු දක්වමින් අදාල ලේඛන තැන්පත් කිරීමේ දින සිට වෙළඳ දින දෙකක් (2) ඇතුලත ලැයිස්තුගත සමාගමේ සමාගම් ලේකම් විසින් CDS වෙත ඒ පිළිබඳ නිසි නිවේදනයක් ලබා දිය යුතු ය. සමාගම් ලේකම්ගෙන් එවැනි නිවේදනයක් ලැබීමෙන් පසුව, යම් විෂමතාවක් නිවැරදි කිරීම සඳහා උචිත පියවර ගැනීමට CDS වෙත හිමිකමක් තිබිය යුතු ය. මේ සම්බන්ධයෙන් CDS විසින් දෙනු ලබන උපදෙස්වලට එකඟව ක්‍රියාකිරීම සඳහා සහභාගිකරුවන් වගකීමට බැඳී සිටිය යුතුය.

(ජී) ඉහතකී නිශ්චිත කාලසීමාව අවසන් වීමට පෙරාතුව ලැයිස්තුගත සමාගමේ සමාගම් ලේකම්වරයාගෙන් CDS වෙත එවැනි නිවේදනයක් ලැබී නොමැති අවස්ථාවක දී, එම තැනපත් කිරීම් නිසි පිළිවෙලකට පවතින බවට CDS විසින් සලකනු ලැබිය යුතු ය.

(එච්) සුරැකුම්පත් සහතික/හිමිකම් සාක්ෂි නැතිවීම පිළිබඳව යම් ලැයිස්තුගත සමාගමක් විසින් වාර්තාවක් ඉදිරිපත් කිරීමේදී සහ ඉදිරිපත් කර ඇති

අවස්ථාවකදී, සහ යම් ලැයිස්තුගත සමාගමක් විසින් සුරැකුම්පත් සහතික/හිමිකම් සාක්ෂිවල යම් වංචාවක් අනාවරණය කර ගනු ලබන අවස්ථාවකදී, හෝ සමාගම් ලේකම් විසින් සුරැකුම්පත් සහතික/හිමිකම් සාක්ෂි අවලංගු කර ඇති අවස්ථාවකදී, ඒ පිළිබඳව වහාම සමාගම් ලේකම් විසින් CDS වෙත දැනුම් දිය යුතුය. CDS වෙත යවනු ලබන එම නිවේදනයේ කොටස්හිමියාගේ නම, සහතිකපත්‍ර අංකය, සුරැකුම්පත් ප්‍රමාණය සහ සමාගමේ නම ඇතුලුව සුරැකුම්පත් සහතික/හිමිකම් සාක්ෂිවලට අදාල තොරතුරු නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(අයි) වලංගු නොවන සුරැකුම්පත් CDS හි තැන්පත් කිරීම් තුලින් උපචිතවන සියලු වගකීම් අදාල සහභාගිකරු විසින් දරනු ලැබිය යුතු ය.

## 7.2 සුරැකුම්පත් තැන්පත් කිරීමේදී සහභාගිකරුවන් විසින් අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය

(ඒ) ගිණුම් හිමියා වෙනුවෙන් සුරැකුම්පත් තැන්පත් කරනු ලබන සහභාගිකරු විසින්, එම සුරැකුම්පත් තැන්පත් කිරීමට පෙරාතුව සුරැකුම්පත් සහතික පත්‍රය/සහතික පත්‍ර හෝ හිමිකම් සාක්ෂිවල අව්‍යාජත්වය/විශ්වසනීයත්වය පිළිබඳ සහ වලංගුභාවය පිළිබඳ සහතික විය යුතු ය. වලංගු නොවන සුරැකුම්පත් තැන්පත් කිරීම මගින් උපචිත වන පාඩු සම්බන්ධයෙන් CDS වගකියනු නොලැබේ.

(බී) සුරැකුම්පත් සහතික පත්‍රයේ හෝ හිමිකම් සාක්ෂියේ අව්‍යාජත්වය පිළිබඳ යම් සැකයක් ඇතිවන අවස්ථාවකදී, ලැයිස්තුගත සමාගමේ සමාගම් ලේකම් සමග සහභාගිකරු සම්බන්ධීකරණය වී කටයුතු කරමින් එම සුරැකුම්පත් සහතිකය හෝ හිමිකම් සාක්ෂිය අව්‍යාජ වේද යන්න පිළිබඳ විමසා බැලිය යුතු වේ. CDS වෙත සුරැකුම්පත් සහතික හෝ හිමිකම් සාක්ෂිය භාරදීමට පෙරාතුව මෙම පූර්ව ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතු ය.

7.3 අලුත් සුරැකුම්පත් නිකුත් කිරීම් හෝ තවදුරටත්වූ සුරැකුම්පත් නිකුත් කිරීම් අනුව නිකුත් කරනු ලබන සුරැකුම්පත් සෘජුවම තැන්පත් කිරීම (සංචිත ආදිය ප්‍රයෝජනයට ගැනීම මගින් සම්පූර්ණයෙන් ගෙවා නිමකරනු ලබන බැර කරන ලද, කොටස් අයිතිවාසිකම් නිකුත් කිරීම, ආදී නිකුත් කිරීම්)

මෙම රීතිවල කුමක් සඳහන්වුවද, CDS විසින් පිළිවෙලින් වූ ගිණුම් හිමියන් වෙනුවෙන් සේවාදායක ගිණුම වෙත තැන්පත් කිරීම සඳහා යම් ලැයිස්තුගත සමාගම්වලින් සහ/හෝ වෙනත් යම් සුරැකුම්පත් නිකුත් කරන්නන්ගෙන් සෘජුවම සුරැකුම්පත් භාර ගනු ලැබිය හැකිය. CDS විසින් එම සෘජු තැන්පත් කිරීම් පිළිබඳ විස්තර අදාල සහභාගිකරු වෙත දැනුම් දෙනු ලැබේ.

## 8 වන කොටස

**සුරැකුම්පත් ප්‍රතිභෞතිකකරණය කිරීම (සුරැකුම්පත් ආපසු ගැනීම)**

8.1 මෙම රීතිවලට යටත්ව, ගිණුම් හිමියා විසින් ස්වකීය ගිණුමේ පවතින සුරැකුම්පත් උකස් කිරීමට අදහස් කරනු ලබන අවස්ථාවකදී, එම ගිණුමේ දරනු ලබන සම්පූර්ණ සුරැකුම්පත් ප්‍රමාණය හෝ එහි යම් කොටසක් ගිණුම් හිමියකු විසින් ප්‍රතිභෞතිකකරණය කිරීම හෝ ආපසු ගැනීම කරනු ලැබිය හැකිය. සුරැකුම්පත් ආපසු ගැනීම සඳහා කරනු ලබන යම් ඉල්ලීමක් CDS හි සේවාදායක ගිණුම පවත්වාගෙන යනු ලබනුයේ යම් සහභාගිකරුවකු හරහාද එම සහභාගිකරු මගින් ඉදිරිපත්කරනු ලැබිය යුතු ය.

8.2 ගිණුම් හිමියකු විසින් සුරැකුම්පත් ප්‍රතිභෞතිකකරණය කිරීම සඳහා කරනු ලබන යම් ඉල්ලීමක් යථාපරිදි සම්පූර්ණ කරන ලද, පිටසන් කරනලද සහ ලියා අත්සන් කරන ලද අදාල CDS ආකෘතියෙන්/ආකෘතිවලින් ඉදිරිපත්කර ඇති බවට සහභාගිකරුවන් විසින් සහතික විය යුතු ය. එම ආකෘතියේ/ආකෘතිවල ලබා දී ඇති සෑම වෙනස් කිරීමක්ම ගිණුම්හිමියා විසින් යථාපරිදි සහතික කර සහභාගිකරු විසින් අනුඅත්සන් කර තිබිය යුතු ය.

8.3 සුරැකුම්පත් වලංගු නොවන ලෙස ඉල්ලා අස්කර ගැනීම හේතුවෙන් උපචිත වන සියලු වගකීම් සහභාගිකරු විසින් දරනු ලැබිය යුතු වේ.

8.4 CDS වෙතින් සුරැකුම්පත් ඉල්ලා අස්කර ගැනීමෙන් පසුව, CDS විසින් එම සුරැකුම්පත් ආපසු ඉල්ලා අස්කර ගනු ලැබූ දිනයේදී ගිණුම් හිමියාගේ නමින් සුරැකුම්පත් සහතිකපත්‍රයක් නිකුත් කිරීමේ කාර්යය සඳහා සුරැකුම්පත් ඉල්ලා අස්කර ගැනීම සම්බන්ධයෙන් ලැයිස්තුගත සමාගමේ අදාල සමාගම් ලේකම්වරයා වෙත දැනුම් දිය යුතු ය. CDS වෙතින් අදාල ලේඛන ලබා ගැනීම සඳහා කටයුතු සැලැස්වීම සමාගම් ලේකම්වරයාගේ වගකීම වන්නේය.

8.5 CDS වෙතින් අදාල ලේඛන ලැබීමේ දින සිට වෙළඳ දින හතක් (7) අවසන් වීමට පෙරාතුව, සුරැකුම්පත් ආපසු ගැනීමට අදාල ගිණුම් හිමියාගේ නමින් නිකුත් කරන ලද සුරැකුම්පත් සහතික පත්‍ර සමාගම් ලේකම් විසින් CDS වෙත භාරදිය යුතුය.

## 9 වන කොටස

**CDS හි සුරැකුම්පත් පැවරීම**

9.1 සේවාදායක ගිණුමකට අදාල සහභාගිකරු වෙනස් කිරීම

**(ඒ) කාර්ය පටිපාටිය**

(i) මෙම රීතිවල සඳහන් විධිවිධානවලට යටත්ව, නියමිත ආකෘතිපත්‍රය සම්පූර්ණ කිරීම මගින් යම් ගිණුම් හිමියකු විසින්, තමා CDS හි සේවාදායක ගිණුම පවත්වාගෙන යනු ලබන්නේ යම් සහභාගිකරුවකු සමගද එම සහභාගිකරු වෙත (වර්තමාන සහභාගිකරු වෙත) එම සේවාදායක ගිණුමේ දරනු ලබන සුරැකුම්පත් එම ගිණුම් හිමියා විසින්ම වෙනත් සහභාගිකරු සමග පවත්වාගෙන යනු ලබන සේවාදායක ගිණුමක් වෙත බැර කිරීම සඳහා උපදෙස් දෙනු ලැබිය හැකිය.

(ii) - සේවාදායක ගිණුමේ දරනු ලබන සුරැකුම්පත් සඳහා ගිණුම් හිමියා විසින් ගෙවීම් කර නැත්නම් මිස ; හෝ

- සහභාගිකරු හෝ වෙනත් යම් ආයතනයක් වෙත ගෙවීම් හිඟව පැවතීම වෙනුවෙන් උකස් කිරීම යටතේ සුරැකුම්පත් දරනු ලබන්නේ නම් මිස ;

සහභාගිකරු වෙනස් කිරීම සඳහා වූ උපදෙස් වර්තමාන සහභාගිකරු විසින් ප්‍රමාද කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම නොකළ යුතු වේ.

(iii) වර්තමාන සහභාගිකරු විසින් සහභාගිකරු වෙනස් කිරීම සඳහා වූ උපදෙස් ක්‍රියාත්මක කිරීමට නොහැකි වේ නම්, එම උපදෙස් ලැබීමේ දින සිට දෙවන වෙළඳ දින හෝ ඊදිනට පෙර ඒ පිළිබඳ නම් කළ සහභාගිකරු වෙත නිවේදනය කරනු ලැබිය යුතු ය.

(iv) ප්‍රමාදය/ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද හේතු පිළිබඳව නම් කළ සහභාගිකරු සෑහීමට පත් නොවේ නම්, එම කරුණ CDS වෙත නිවේදනය කරනු ලැබිය යුතු ය. එම ප්‍රමාදය/ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව හේතු CDS විසින් සලකා බලා උචිත පියවර ගනු ලැබිය යුතු ය.

**(බී) විමසා තහවුරු කර ගැනීම**

ගිණුම් හිමියකුගේ උපදෙස් ක්‍රියාත්මක කිරීමේ දී, ඉල්ලීමේ තත්‍ය භාවය / අව්‍යාජත්වය පරීක්ෂා කර බලා සහතික කර ගැනීම සහභාගිකරුගේ වගකීම වන්නේය.

**9.2 වෙන වෙනම ගිණුම් හිමියන් විසින් දරනු ලබන සේවාදායක ගිණුම් අතර සුරැකුම්පත් මාරු කිරීම (අන්තර් ගිණුම් අතර සුරැකුම්පත් මාරු කිරීම)**

CSE හි වෙළඳාම් කිරීමේ කාර්ය පටිපාටියෙන් පරිබාහිරව, එක් සේවාදායක ගිණුමකින් තවත් සේවාදායක ගිණුමක් වෙත කොටස් මාරු කිරීමේ කාර්ය සඳහා සහභාගිකරුවන් විසින් SEC හි පූර්ව ලිඛිත අනුමතිය නියමිත ආකෘතියට අනුව ලබා ගත යුතු ය.

SEC වෙතින් ලැබෙන මුල් අනුමත ලිපියද සමග සියලු පැවරීම් ඉල්ලුම්පත්‍ර CDS වෙත භාරදෙනු ලැබිය යුතුය.

**9.3 2003 වර්ෂයේ සංශෝධිත 1995 සමාගම් අත්කර ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය යටතේ කරනු ලබන අර්පනයකට අනුව කොටස් පැවරීම / CSE හි ලැයිස්තුවෙන් ඉවත් කිරීම [De-listing]**

2003 වර්ෂයේ සංශෝධිත 1995 සමාගම් අත්කර ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය යටතේ කරනු ලබන අර්පනයකට සම්බන්ධව හෝ ලැයිස්තුවෙන් ඉවත්කිරීමකට සම්බන්ධව සුරැකුම්පත් පැවරීමට අදාලව උපදෙස් ලැබීමෙන් පසුව CDS විසින් එම කොටස් අර්පණකරුගේ සංචිත ගිණුම වෙත මාරුකරනු ලැබිය හැකිය. ගෙවීම් තහවුරු කර ගැනීමෙන් පසුව, CDS විසින් අර්පණකරුගේ සේවාදායක ගිණුම වෙත එම කොටස් මාරු කරනු ලැබිය යුතු ය.

## 9.4 ගිණුම් හිමියකු මිය යෑමේදී CDS හි තැන්පත් සුරැකුම්පත් සම්ප්‍රේෂණය කිරීම

ගිණුම් හිමියකු මිය යන අවස්ථාවකදී, CDS හි එම ගිණුම් හිමියා විසින් දරනු ලබන සුරැකුම්පත් ප්‍රමාණය ඔහුගේ / ඇයගේ නෛතික උරුමක්කරුවන් වෙත සම්ප්‍රේෂනය කරනු ලැබිය යුතු ය.

මෙම කාර්ය සඳහා එම සුරැකුම්පත් පැවරීම සඳහා වූ ඉල්ලීමක් පිළිවෙලින් වූ සහභාගිකරු / සහභාගිකරුවන් හරහා නියමිත ආකෘතියෙන්/ආකෘතිවලින් CDS වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

## 10 වන කොටස

### හිමිකම්

### 10.1 සේවාදායක ගිණුම සඳහා හිමිකම් ලැබීම

(ඒ) පහත 10.6 රීතියට යටත්ව, CDS විසින් සපයනු ලබන තොරතුරු මත පදනම්ව, ලැයිස්තුගත සමාගමේ සමාගම් ලේකම් විසින් CDS ගිණුම් හිමියන්ගේ හිමිකම් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

(බී) ලාභාංශ ගෙවීම, සංචිත භාවිත කිරීම මගින් සම්පූර්ණයෙන් ගෙවා නිමි ආකාරයට කොටස් පැවරීම හෝ අයිතිවාසිකම් පැවරීම මාර්ගයෙන් හෝ වෙනත් යම් බෙදාහැරීමක් වැනි සංස්ථාපිත ක්‍රියාවක් සඳහා ගිණුම් හිමියාගේ හිමිකම් ලැබීමේ දිනයේදී ස්වකීය සේවාදායක ගිණුමේ දරනු ලබන සුරැකුම්පත් ප්‍රමාණය මත පදනම්ව තීරණය කරනු ලැබිය යුතු ය.

(සී) AON Block පහසුකම භාවිත කරමින් CSE හි ස්වංක්‍රිය වෙළඳ ක්‍රමය මත සිදු කරනු ලබන වෙළඳාමක් සම්බන්ධයෙන් ගැණුම්කරුවෙකු/ගැණුම්කරුවන් විසින් පැහැර හැරීමක් සිදු කරනු ලැබුවහොත් CDS මගින් උපදෙස් දෙන පරිදි එවැනි AON වෙළඳාමකට පසුව CDS හි ගැණුම්කරුට/ගැණුම්කරුවන්ට ඇති ගිණුම්වලට උපචිත වන ආයතනික හිමිකම් ලැයිස්තුගත ආයතනය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

### 10.2 ලාභාංශ

(ඒ) ලැයිස්තුගත සමාගමක් විසින් ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීමේදී, හිමිකම් දිනය වන විට එම සුරැකුම්පත් සම්බන්ධ ස්වකීය පිළිවෙලින් වූ සුරැකුම්පත් දැරීමේ ගිණුම් හිමියන් පිළිබඳ ලැයිස්තුවක් CDS විසින් ලැයිස්තුගත සමාගමේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(බී) මුදල් ලාභාංශයක් සම්බන්ධයෙන් වන විට, ලැයිස්තුගත සමාගම විසින් පිළිවෙලින් වූ ගිණුම් හිමියන් වෙත සෘජුවම ලාභාංශ ගෙවීම් යොමු කරනු ලැබිය යුතුය.

(සී) හින්න කොටස් ලාභාංශයක් (scrip dividend) සම්බන්ධයෙන් වන විට, සමාගම් ලේකම්වරයා විසින් CDS වෙත සපයා ඇති තොරතුරුවලට අනුව, වෙන් කරන ලද කොටස් සෘජුවම පිළිවෙලින් වූ සේවාදායක ගිණුම් වෙත තැන්පත් කරනු ලැබිය යුතුය.

## 10.3 සංචිත ප්‍රයෝජනයට ගැනීම මගින් සම්පූර්ණයෙන් ගෙවා නිමි වශයෙන් වූ බැර කිරීමේ කොටස් නිකුත් කිරීම

ලැයිස්තුගත සමාගමක් විසින් සංචිත ප්‍රයෝජනයට ගැනීම මගින් සම්පූර්ණයෙන් ගෙවා නිමි වශයෙන් වූ බැරකිරීමේ කොටස් නිකුත්කරනු ලබන අවස්ථාවකදී, හිමිකම්ලාභී / බෙදා වෙන්කිරීමේ දිනයේදී එම ලැයිස්තුගත සමාගමේ සුරැකුම්පත් සම්බන්ධයෙන් ස්වකීය පිළිවෙලින්වූ සුරැකුම්පත් දැරීමේ ගිණුම් හිමියන්ගේ ලැයිස්තුවක් CDS විසින් ලැයිස්තුගත සමාගමේ සමාගම් ලේකම්වරයා වෙත ඉදිරිපත්කරනු ලැබිය යුතුය.

සමාගම් ලේකම්වරයා විසින් CDS වෙත සපයා ඇති තොරතුරුවලට අනුව පිළිවෙලින් වූ සේවාදායක ගිණුම් වෙත එම වෙන් කරන ලද කොටස් සෘජුවම තැන්පත් කරනු ලැබිය යුතුය.

## 10.4 හිමිකම් නිකුත් කිරීම

(ඒ) ලැයිස්තුගත සමාගමක් විසින් හිමිකම් නිකුත් කිරීමේදී, හිමිකම් ලැබීමේ දිනය වන විට අදාල ලැයිස්තුගත සමාගමේ පිළිවෙලින් වූ සුරැකුම්පත් දැරීමක් සහිත ගිණුම් හිමියන්ගේ ලැයිස්තුවක් CDS විසින් ලැයිස්තුගත සමාගමේ සමාගම් ලේකම්වරයා වෙත සපයනු ලැබිය යුතු ය.

(බී) පහත 10.6 රීතියට යටත්ව CDS විසින් ලබාදුන් තොරතුරුවලට අනුව ලැයිස්තුගත සමාගම විසින් පිළිවෙලින් වූ ගිණුම් හිමියන් වෙත සෘජුවම සුරැකුම්පත් වෙන් කිරීමේ යාවකාලින (Provisional Letters of Allotment) ලිපි තැපැල්කරනු ලැබිය යුතුය.

(සී) යම් ගිණුම් හිමියකු විසින් හිමිකම් නිකුත් කිරීම තුලින් උපචිත වන තාවකාලික අයිතිවාසිකම් පැවරීම් ස්වකීය සහභාගිකරු හරහා CDS වෙත අත්හරිනු ලැබිය හැකිය. මෙම කාර්ය සඳහා ගිණුම් හිමියා විසින් ස්වකීය සහභාගිකරු හරහා යථාපරිදි සම්පූර්ණ

කරන ලද තාවකාලික කොටස් පැවරීමේ ලිපිය පිළිවෙලින් වූ සේවාදායක ගිණුමේ තැන්පත් කරනු ලැබිය යුතු ය. ගිණුම් හිමියා විසින් එකී අයිතිවාසිකම් ස්වකීය සහභාගිකරු හරහා වෙළඳාම් කරනු ලැබිය හැකිය. එකී තැන්පත් කිරීම් සහ අයිතිවාසිකම් වෙළඳාම් කිරීම සඳහා, එම අයිතිවාසිකම් නිකුත් කිරීම අත්හැරීමේ කාලසීමාව තුල දී අවසර ලබා දිය යුතු වේ.

(ඩී) හිමිකම් කොටස් අත්හැරීමේ දිනය වන විට සහභාගිකරු හරහා CDS හි අයිතිවාසිකම් දැරීම පිළිබඳ සඳහන් කරමින් එම හිමිකම් දරන්නා වූ ගිණුම් හිමියන්ගේ ලැයිස්තුවක් CDS විසින් සහභාගිකරුවන් වෙත භාරදෙනු ලැබිය යුතු ය. හිමිකම් පිළිගැනීමේ අවසාන දිනයේදී 10.30 පැය වන විට ගිණුම් හිමියන් විසින් CDS වෙත දායක කර ඇති හිමිකම් කොටස් පිළිබඳව සහභාගිකරුවන් විසින් අදාල ගෙවීම් භාර දිය යුතුය. එම ගෙවීම් CDS විසින් අදාල ලැයිස්තුගත සමාගම වෙත යථාපරිදි ඉදිරිපත් කර තිබිය යුතුය. ගිණුම් හිමියන් විසින් දායකකර නොමැති හිමිකම් පිළිබඳ විස්තර හිමිකම් පිළිගැනීමේ අවසාන දිනයේ 10.30 පැය වන විට පිළිවෙලින් වූ සහභාගිකරුවන් විසින් CDS වෙත නිවේදනය කරනු ලැබිය යුතුය. ගිණුම් හිමියන් විසින් දායක කර නොමැති එවැනි අයිතිවාසිකම් CDS විසින් යථාපරිදි ආපසු ලබා ගනු ලැබේ.

(ඊ) හිමිකම් නිකුත් කිරීමට අනුව CSE හි එම කොටස් ලැයිස්තුගත කිරීමෙන් පසුව ලැයිස්තුගත ආයතනයේ සමාගම් ලේකම්වරයා විසින් ලබා දෙන උපදෙස්වලට අනුව CDS හි ගිණුම් හිමියන් විසින් යථාපරිදි දායකකර ඇති හිමිකම් කොටස් බවට පරිවර්තනය කරනු ලැබේ.

10.5 වෙළඳාම් කිරීමේ දිනය සහ ගෙවා නිරාකරණය කිරීමේ දිනය අතරතුරදී යම් ගිණුම් හිමියකු වෙත හිමිකම් හෝ ලාභාංශ උපචිත වන අවස්ථාවකදී, සහ එම ගිණුම් හිමියා විසින් මිලදී ගනු ලබන කොටස් සඳහා ගෙවීම් කිරීම පැහැරහරිනු ලබන අවස්ථාවකදී, සහභාගිකරු වෙත පහත දැක්වෙන හිමිකම් තිබිය යුත්තේය:-

(ඒ) හිමිකම් නිකුත් කිරීමක් සම්බන්ධයෙන් වන විට) තාවකාලික කොටස් පැවරීමේ දිනය බැහැර කිරීමෙන් පසුව වෙළඳ දින පහක් (5) නොඉක්මවන පරිදි හෝ (ලාභාංශයක් සම්බන්ධයෙන් වන විට) ගෙවීම් කිරීමේ දිනය බැහැර කිරීමෙන් පසුව වෙළඳ දින පහක්

(5) නොඉක්මවන පරිදි, තාවකාලික කොටස් පැවරීමේ ලිපිය භාරදීමට පෙරාතුව, එම හිමිකම් සහභාගිකරු වෙනුවෙන් පවරන ලෙස CDS වෙත ලිඛිතව ඉල්ලා සිටීම;

(බී) එවැනි ඉල්ලීමක් ලැබීමේදී, CDS විසින් එම සහභාගිකරු වෙනුවෙන් හිමිකම් ( හිමිකම් හෝ ලාභාංශ) නිකුත් කරන ලෙස අදාල ලැයිස්තුගත සමාගම වෙත නිවේදනය කරනු ලැබිය යුතුය.

10.6 CDS විසින් ලබා දෙන (හිමිකම් පිළිබඳ) උපදෙස් / කරුණු හරවා යැවීම පිළිබඳව හේතු දක්වමින් ලැයිස්තුගත සමාගමේ සමාගම් ලේකම්වරයා සෑහීමට පත්වන පරිදි ගිණුම් හිමියා විසින් ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කර ඇත්නම්, ලැයිස්තුගත සමාගමේ සමාගම් ලේකම්වරයා විසින් ඔහුගේ/ඇයගේ/එහි අභිමතය පරිදි සහ අවදානම් දැරීම යටතේ ආයතන ප්‍රතිලාභයන් සඳහා හිමිකම් ඇති යම් ගිණුම් හිමියකුගේ ලිපිනය වෙත හෝ ලාභාංශ ගෙවීමේ උපදෙස්වලට අදාලව CDS විසින් ලබා දෙන තොරතුරු වෙනත් ස්ථානයකට හරවා යැවීම කරනු ලැබිය හැකිය.

## 11 වන කොටස

**CDS ගිණුම් ප්‍රකාශ**

### 11.1 කාලීන CDS ගිණුම් ප්‍රකාශ

CDS විසින් පහත දැක්වෙන කරුණු අන්තර්ගතවන CDS ගිණුම් ප්‍රකාශයක් ගිණුම් හිමියන් වෙත යොමුකරනු ලැබිය යුතු ය.

(ඒ) ගිණුම් හිමියා විසින් දරනු ලබන සියලු ලැයිස්තුගත සුරැකුම්පත් ; සහ

(බී) එම සේවාදායක ගිණුමේ ඇති ලැයිස්තුගත කරන ලද සුරැකුම්පත් ප්‍රමාණය.

CDS විසින් CDS ගිණුම් ප්‍රකාශය සෘජුවම ගිණුම් හිමියා වෙත ඉදිරිපත් කරනු ලැබේ. භාරකාර බැංකුවක් හරහා සේවාදායක ගිණුමක් පවත්වාගෙන යනු ලබන අවස්ථාවකදී, CDS වෙනුවෙන් සේවාදායක ගිණුම පවත්වාගෙන යනු ලබන අදාල භාරකාර බැංකුව හරහා ගිණුම් හිමියා වෙත ගිණුම් ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබේ.

අදාල සහභාගිකරු හරහා ගිණුම් හිමියා විසින් සපයනු ලබන විද්‍යුත් ලිපිනය වෙත ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් CDS ගිණුම් ප්‍රකාශ යවනු ලැබිය හැකිය. CDS වෙත සපයා ඇති විද්‍යුත් ලිපිනය අදාල CDS ගිණුම් හිමියන්ගෙන් ලබා ගෙන ඇති බවට සහභාගිකරුවන් විසින් සහතික විය යුතු ය.

අදාල සහභාගිකරු හරහා ලිඛිතව ගිණුම් හිමියකු විසින් ඉල්ලීමක් කිරීමේදී, CDS විසින් එම ගිණුම් හිමියා වෙත මුද්‍රිත ආකාරයෙන් CDS ගිණුම් ප්‍රකාශ යොමුකරනු ලැබිය යුතු ය.

CDS ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීමේ කාලසීමා පහත දැක්වෙන පරිදි වේ.:-

(ඒ) යම් නිශ්චිත මාසයක් තුලදී යම් ගිණුමක් ක්‍රියාත්මකව පැවතියේ නම්, CDS විසින් අදාල ගිණුම් හිමියා වෙත මාසික ගිණුම් ප්‍රකාශයක් යොමුකරනු ලැබිය යුතුය. (මාසික ගිණුම් ප්‍රකාශය)

(බී) පසුගිය මාස තුනක කාලය තුලදී යම් ගිණුමක් ක්‍රියාත්මකව පැවතියේ නම් CDS විසින් අදාල ගිණුම් හිමියා වෙත කාර්තුමය ගිණුම් ප්‍රකාශයක් යොමුකරනු ලැබිය යුතුය. (කාර්තුමය ගිණුම් ප්‍රකාශය)

ඉහත (ඒ) සහ (බී) රීතියේ කාර්ය සඳහා ක්‍රියාකාරී ගිණුමක් යනු ඉහතකී කාලය/කාලසීමා තුලදී යටත් පිරිසෙයින් එක් ගනුදෙනුවක් හෝ (මිල දී ගැනීම/විකිණීම/තැන්පත් කිරීම/ආපසු ගැනීම/පැවරීම) සිදු වී ඇති යම් ගිණුමක් අදහස් වේ.

(සී) බැරකම් ශේෂ පවතින අක්‍රීය ගිණුම් හිමියන් වෙත CDS විසින් මාර්තු 31 වන දිනයේදී වාර්ෂික ගිණුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය. (මාස 12 ක කාලසීමාවක් සඳහා කිසිදු ගනුදෙනුවක් සිදු වී නොමැති ගිණුම්)

## 11.2 ආපසු ලැබෙන CDS ගිණුම් ප්‍රකාශ

### (ඒ) ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් යවනු ලබන CDS ගිණුම් ප්‍රකාශ

CDS සමග ලියාපදිංචි වී ඇති විද්‍යුත් ලිපිනය වෙත යොමුකරන ලද CDS ගිණුම් ප්‍රකාශයක් CDS වෙත ආපසු ලැබී ඇති අවස්ථාවකදී හෝ යම් ගිණුම් හිමියකු විසින් ඉලෙක්ට්‍රෝනික අකාරයෙන් යවනු ලබන CDS ගිණුම් ප්‍රකාශය තමා වෙත ලැබී නොමැති බවට CDS වෙත ලිඛිතව දැනුම් දෙනු ලබන අවස්ථාවකදී, ගිණුම් ප්‍රකාශය යවනු ලැබිය යුතු විකල්ප විද්‍යුත් ලිපිනයක් ගිණුම් හිමියාගෙන් ලබා ගන්නා ලෙස CDS විසින් අදාල සහභාගිකරුවන් ලිඛිතව ඉල්ලා සිටිනු ලැබිය යුතුය. එම ඉල්ලීමේ දින සිට එක් සතියක කාලයක් (01) ඇතුලත මෙහි සඳහන් පරිදි CDS වෙත විකල්ප විද්‍යුත් ලිපිනයක් සහභාගිකරු විසින් සපයනු නොලබන අවස්ථාවකදී, CDS සමග ලියාපදිංචි වී ඇති තැපැල් ලිපිනය වෙත CDS විසින් මුද්‍රිත ආකාරයෙන් CDS ගිණුම් ප්‍රකාශය යවනු ලැබිය යුතු ය.

**(බී) මුද්‍රිත ආකාරයෙන් යවනු ලබන CDS ගිණුම් ප්‍රකාශ**

CDS සමග ලියාපදිංචි වී ඇති ලිපිනය වෙත යොමු කරන ලද CDS ගිණුම් ප්‍රකාශයක් CDS වෙත ආපසු ලැබී ඇති අවස්ථාවකදී, ගිණුම් ප්‍රකාශය යැවිය යුතු විකල්ප ලිපිනයක් ගිණුම් හිමියාගෙන් ලබා ගන්නා ලෙස CDS විසින් අදාල සහභාගිකරු වෙත නියම කරනු ලැබිය යුතුය. ඉල්ලීම ඉදිරිපත් කිරීමේ දින සිට සති දෙකක කාලයක් ඇතුලත මෙහි සඳහන් පරිදි CDS වෙත සහභාගිකරු විසින් විකල්ප ලිපිනයක් ලබා නොදෙන අවස්ථාවකදී, අදාල සේවාදායක ගිණුමේ ගනුදෙනු කටයුතු CDS විසින් අත්හිටවනු ලැබිය යුතුය. ගිණුම් හිමියන්ගේ ලියාපදිංචි ලිපිනය වශයෙන් පසුව සලකනු ලැබිය යුතු වූ විකල්ප ලිපිනයක් අදාල කොටස් ගනුදෙනුකරු හරහා CDS වෙත ගිණුම් හිමියා විසින් ලිඛිතව නිවේදනය කරනු ලබන තෙක්, ගිණුම් හිමියාගේ ලියාපදිංචි ලිපිනය වෙත ඉන්පසුව CDS විසින් CDS ගිණුම් ප්‍රකාශ යොමුකරනු නොලැබිය යුතුය. ගිණුම් ප්‍රකාශ භාරදිය හැකි ලිපිනයක් ගිණුම් හිමියා විසින් දැනුම් දීමෙන් පසුව, අදාල සේවාදායක ගිණුමේ ගනුදෙනු කටයුතු අත්හිටුවීම CDS විසින් ඉවත්කරනු ලැබිය යුතුය.

එසේ වුවද, යම් කොටස් තැරැව්කාර සහභාගිකරුවකු විසින් කරනු ලබන ඉල්ලීමකට අනුව, ගිණුම් හිමියාගෙන් කොටස් තැරැව්කාර සහභාගිකරු වෙත ලැබිය යුතු මුදල් අයකර ගැනීම සඳහා වූ කොටස් තැරැව්කාර සහභාගිකරුගේ අයිතිවාසිකම් සේවාදායක ගිණුමක් අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස අවහිර වන අවස්ථාවකදී, CDS විසින් මෙම රීතිය ප්‍රකාරව පනවා ඇති යම් සේවාදායක ගිණුමක් අත්හිටුවීම ඉවත් කරනු ලැබිය හැකිය.

එම අත්හිටුවීම ඉවත් කිරීමට පෙරාතුව, පහත දැක්වෙන හේතු ඉදිරිපත් කරමින් CDS විසින් කොටස් තැරැව්කාර සහභාගිකරුගේ ප්‍රධාන විධායක නිලධරයාගෙන් දිව්රුම් ප්‍රකාශයක් ලබාගත යුතු වේ. :-

- CDS ගිණුම විවෘත කරනු ලබන අවස්ථාවේදී “ඔබගේ ගනුදෙනුකරු හොඳින් අවබෝධකර ගැනීම” (Know your customer) යන කරුණු සමග එකඟව ක්‍රියාකිරීම සඳහා අවශ්‍ය සියලු සාධාරණ පියවර කොටස් තැරැව්කාර සහභාගිකරු විසින් අනුගමනය කර තිබෙන බව;

- ගිණුම් හිමියා කොටස් තැරැව්කාර සහභාගිකරු වෙත මුදල් ගෙවීමට ඇති බව;

- ගිණුම් හිමියා විසින් හිමිකම්පෑමක් කරන අවස්ථාවකදී එම හිමිකම්පෑමට අනුව කොටස් තැරැව්කාර සහභාගිකරු විසින් CDS සහ හෝ CSE සඳහා හානිපූරණයක් තැබීමට එකඟ වන බව ; සහ

- ගිණුම් හිමියා විමසා බැලීම සඳහා කොටස් තැරැව්කාර සහභාගිකරු විසින් ප්‍රමාණවත් උත්සාහයක් දරා ඇති අතර ඒ සඳහා සහභාගිකරු විසින් ගත් පහත දැක්වෙන පියවර ඇතුලත් වන බව,

1. ශ්‍රව්‍ය සන්නිවේදනය මගින් සහ/හෝ ඊ මේල් හරහා ගිණුම් හිමියා හා සම්බන්ධවීමට කොටස් තැරැව්කාර සහභාගිකරු විසින් උත්සාහ දරා තිබීම. (ඊ මේල් මගින් කරන ලද සන්නිවේදනය පිළිබඳ සාක්ෂියක් දිව්රුම් ප්‍රකාශය සමග අමුණා තිබිය යුතුය.)

2. CDS ගිණුම් ප්‍රකාශය ආපසු ලැබීමට අදාලව CDS සමග ලියාපදිංචි වී ඇති ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් කොටස් තැරැව්කාර සහභාගිකරු විසින් ගිණුම් හිමියාට සන්නිවේදනයක් ලබා දී තිබීම. (ලියාපදිංචි තැපෑලෙන් එවා ඇති සන්නිවේදනයක් පිළිබඳ සාධකයක් දිව්රුම් පෙත්සම සමග අමුණා තිබිය යුතුය.)

3. ගිණුම් හිමියා විමසා බැලීම සඳහා කොටස් තැරැව්කාර ගනුදෙනුකරු විසින් ගත් වෙනත් යම් පියවර (අදාල වන අවස්ථාවලදී).

### 11.3 CDS ගිණුම් ප්‍රකාශවල - පිටපත්

යම් ගිණුම් හිමියකු විසින් CDS ගිණුම් ප්‍රකාශයක අතිරේක මුද්‍රිත පිටපතක් ලබා ගැනීමට අදහස් කරනු ලබන අවස්ථාවකදී, ගිණුම් හිමියා විසින් අදාල සහභාගිකරු මගින් හෝ පුද්ගලිකව CDS කාර්යාලය වෙත පැමිණ ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර ස්වකීය අනන්‍යතාවය ඉදිරිපත් කිරීමෙන් පසුව එම ගිණුම් ප්‍රකාශය ලබා ගත හැකිය.

විකල්පයක් වශයෙන්, CDS ගිණුම් ප්‍රකාශයේ අතිරේක පිටපතක් ඉල්ලමින් ගිණුම් හිමියා විසින් CDS වෙත ලිඛිතව ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය. ගිණුම් හිමියා විසින් ඉල්ලා ඇති ආකාරයට CDS විසින් එම CDS ගිණුම් ප්‍රකාශය CDS සමග ලියාපදිංචි වී ඇති ගිණුම් හිමියාගේ තැපැල් ලිපිනය වෙත හෝ විද්‍යුත් ලිපිනය වෙත යොමුකරනු ලැබිය යුතුය.

CDS ගිණුම් ප්‍රකාශවල අතිරේක මුද්‍රිත පිටපත් සැපයීම වෙනුවෙන් ගිණුම් හිමියන්ගෙන් CDS විසින් ගාස්තුවක් අයකරනු ලැබිය හැකිය.

## 12 වන කොටස

**අන්තර් සහභාගිකරුවන් අතර ගෙවා නිරාකරණය කිරීම් පැහැරහැරීම් පාලනය කරනු ලබන රීති.**

### 12.1 කොටස් තැරැව්කාර සහභාගිකරුවකු විසින් ගෙවා නිරාකරණය කිරීම් පැහැරහැරීම

යම් කොටස් තැරැව්කාර සහභාගිකරුවකු විසින් කරනු ලබන ගෙවා නිරාකරණය කිරීම් පැහැරහැරීමක් සම්බන්ධයෙන් CDS විසින් පහත සඳහන් කාර්යපටිපාටිය අනුගමනය කරනු ලැබිය යුතුය;

(i) යම් කොටස් තැරැව්කාර සහභාගිකරුවකු විසින් ගෙවා නිරාකරණය කිරීමක් පැහැර හරිනු ලබන අවස්ථාවකදී, එම කොටස් සහභාගිකරුගේ සේවාදායකයන් වෙනුවෙන් තවදුරටත් වූ මිලදී ගැනීම් කිරීමෙන් එම කොටස් සහභාගිකරු වහාම අත්හිටුවනු ලැබිය යුතුය.

(ii) කොටස් තැරැව්කාර සහභාගිකරු විසින් සිදු කරන ලද ගෙවා නිරාකරණය කිරීම පැහැරහැරීම පිළිබඳව ශ්‍රී ලංකාවේ පුළුල් ව්‍යාප්තියක් සහිත ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවලින් වන පුවත්පතක CDS විසින් නිවේදනයක් පළකරනු ලැබිය යුතුය.

(iii) අත්හිටුවීමේ දින සිට 15 වන වෙළඳ දිනය දක්වා ස්වකීය ගනුදෙනුකරුවන් වෙනුවෙන් කොටස් විකිණීම අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා එම ගෙවීම් පැහැර හරින ලද කොටස් තැරැව්කාර සහභාගිකරු වෙත අවසර දෙනු ලැබිය හැකිය.

(iv) මිලදී ගැනීම් අත්හිටුවීමේ දින සිට 15 වන වෙළඳ දිනය අවසන් වන දිනය වන විට සියලු හිඟ මුදල් ගෙවා නිරාකරණය කිරීමේ වගකීම් සපුරාලීමට කොටස් තැරැව්කාර සහභාගිකරු අපොහොසත් වේ නම්, ඉහත කී පරිදි 15 වන වෙළඳ දිනය අවසන් වීමේ සිට බලපැවැත්වෙන පරිදි ස්වකීය සේවාදායකයන් වෙනුවෙන් විකිණීම් පවත්වාගෙන යෑමෙන්ද එවැනි සහභාගිකරුවන් අත්හිටුවනු ලැබේ.

(v) මෙහි සඳහන් අත්හිටුවීම් තිබුණද, එම කොටස් තැරැව්කාර සහභාගිකරු විසින් වෙනත් සහභාගිකරුවන් වෙත මුදල් ගෙවා නිරාකරණය කිරීම සම්බන්ධයෙන් වූ වගකීම් අඛණ්ඩව ඉටුකරනු ලැබිය යුතුය.

(vi) ගෙවීම් පැහැරහරින ලද කොටස් තැරැව්කාර සහභාගිකරු විසින් ලබා ගන්නා සියලු විකුණුම් ප්‍රතිශ්ඨා මුදල් පිළිවෙලින් වූ විකුණුම්කරුවන් වෙත ගෙවීම් කිරීම සඳහා භාවිත කරනු ලබන බවට එම ගෙවීම් පැහැරහැරීමේ කොටස් තැරැව්කාර සහභාගිකරු විසින් සහතික විය යුතුය.

(vii) ගෙවීම් පැහැරහැරීමේ යම් කොටස් තැරැව්කාර සහභාගිකරුවකු සමග කොටස් දරනු ලබන ගිණුම් හිමියන් විසින් ස්වකීය තේරීම අනුව එම ගෙවීම් පැහැරහැරීමේ සහභාගිකරුගෙන් වෙනත් යම් සහභාගිකරුවකු වෙත මාරු විය හැකිය. යම් හිඟ මුදල් වගකීම් නිරාකරණය කිරීමෙන් පසුව පමණක් ගිණුම් හිමියන් විසින් එසේ ක්‍රියාකරනු ලැබිය හැකිය. CDS හි සහභාගිකරු මාරු කිරීම මෙම රීතිවල 9.1 රීතිය ප්‍රකාරව සිදු කරනු ලැබිය යුතු ය.

(viii) ගෙවා නිමකිරීමේ සහතික අරමුදල [Settlement Guarantee Fund (SGF)] විසින් නිශ්චිතව දක්වනු ලබන කොන්දේසිවලට යටත්ව, ගෙවා නිරාකරණය කිරීමේ වගකීම් ඉටුකිරීම සඳහා එම පැහැරහැරීමේ කොටස් තැරැව්කාර සහභාගිකරු විසින් ගෙවා නිරාකරණය කිරීමේ සහතික අරමුදලින් (SGF) අරමුදල් ලබා ගත හැකිය.

**12.2 භාරකාර බැංකුවක් විසින් ගෙවීම් නිරාකරණය කිරීම පැහැරහැරීම**

යම් භාරකාර බැංකුවක් විසින් ගෙවීම් නිරාකරණය කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවකදී, CDS විසින් පහත දැක්වෙන කාර්ය පටිපාටිය අනුගමනය කරනු ලැබිය යුතුය.

(ඒ) භාරකාර සහභාගිකරුවකු (භාරකාර බැංකුවක්) විසින් ගෙවීම් නිරාකරණය කිරීම පැහැර හරිනු ලබන අවස්ථාවකදී, CDS කර්තව්‍ය ඉටු කිරීමෙන් එවැනි සහභාගිකරුවකු වහාම අත්හිටුවනු ලැබිය යුතු ය.

(බී) භාරකාර බැංකුවක් විසින් සිදු කරනු ලබන ගෙවා නිරාකරණය කිරීම් පැහැරහැරීමක් පිළිබඳව CDS විසින් ශ්‍රී ලංකාවේ පුළුල් ව්‍යාප්තියක් සහිත ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවලින් වන පුවත්පතක නිවේදනයක් ප්‍රසිද්ධ කරනු ලැබිය යුතුය.

(සී) මෙහි සඳහන් අත්හිටුවීම තිබුණද වෙනත් සහභාගිකරුවන් සඳහා වූ අරමුදල් ගෙවා නිරාකරණය කිරීම පිළිබඳ ස්වකීය වගකීම් එම භාරකාර බැංකුව විසින් අඛණ්ඩව ඉටුකළ යුතු වේ.

(ඩී) ගෙවීම් පැහැර හැරීමේ භාරකාර බැංකුවක් සමග කොටස් දරනු ලබන ගිණුම් හිමියන් විසින් ස්වකීය තේරීම පරිදි එම පැහැරහැරීමේ භාරකාර බැංකුවෙන් වෙනත් සහභාගිකරුවෙකු වෙත මාරු විය හැකිය. හිඟ මුදල් ගෙවා නිරාකරණය කිරීමෙන් පසුව පමණක් ගිණුම් හිමියන් විසින් එසේ ක්‍රියාකරනු ලැබිය හැකි වේ. CDS හි සහභාගිකරුවන් මාරු කිරීම මෙම රීතිවල 9.1 රීතිය ප්‍රකාරව සිදු විය යුතු වේ.

## 13 වන කොටස

### පොදු විධිවිධාන

### 13.1 CDS තොරතුරු නිදහස් කිරීම

**(ඒ) සේවාදායක ගිණුමකට අදාල තොරතුරු**

පහත දැක්වෙන අවස්ථාවලදී CDS විසින් සේවාදායක ගිණුමකට අදාල තොරතුරු නිදහස් කරනු ලැබේ. :-

(i) අදාල සහභාගිකරු විසින් ලිඛිත ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවකදී ;

(ii) ගිණුම් හිමියකු විසින් ලිඛිත ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවකදී :

(එම ගිණුම් හිමියාගේ ලියාපදිංචි ලිපිනය/ඊ මේල් ලිපිනය / දුරකථන අංකය වෙත හෝ නියමිත අනන්‍යතාවය විමසා බැලීමෙන් පසුව ගිණුම් හිමියා වෙත භාරදීම මගින් CDS විසින් එම තොරතුරු ඉදිරිපත් කරනු ලැබිය යුතුය.)

(iii) අදාල සමාගම් ලේකම්වරයා විසින් ලිඛිත ඉල්ලීමක් කිරීමෙන් පසුව;

(iv) අදාල නීතියක් මගින් හෝ අධිකරණ නියෝගයක් මගින් නියම කර ඇත්නම්;

(v) SEC විසින් ලිඛිත ඉල්ලීමක් කිරීමෙන් පසුව ;

(vi) ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය (FIU) විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසුව.

**(බී) අරමුදල් ගෙවා නිරාකරණය කිරීමට අදාල තොරතුරු**

මෙම රීතිවල 6 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට CDS හි ගෙවා නිරාකරණය කිරීමේ බැංකුව/බැංකු වෙත අරමුදල් ගෙවා නිරාකරණය කිරීමට අදාල තොරතුරු CDS විසින් නිදහස් කරනු ලැබිය යුතුය.

## 13. 2 CDS විසින් ගනු ලබන පියවර

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබිය යුතු පියවර රීති මගින් නිශ්චිතව දක්වා ඇති අවස්ථාවලදී හැර අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා හෝ CDS හි කළමනාකාරවරයා හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කල නම් කරනු ලබන වෙනත් යම් පුද්ගලයකු CDS වෙනුවෙන් ක්‍රියාකරනු ලැබිය යුතු ය.

13.3

(i) CDS අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ එම මණ්ඩලය විසින් පිහිටවනු ලබන යම් කමිටුවක සාමාජිකයකු ;

(ii) CDS හි ක්‍රියාකාරකම් පවත්වාගෙන යෑම සඳහා නම් කරනු ලබන යම් නිලධරයකු; සහ

(iii) CDS විධානය යටතේ ක්‍රියාකරනු ලබන යම් නියෝජිතයකු හෝ තැනැත්තකු;

ඇතුළුව CDS වෙනුවෙන් ක්‍රියාකරනු ලබන ඕනෑම තැනැත්තකු 1997 අංක 26 දරන අසාධාරණ ගිවිසුම් නියම පනත මගින් නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට හැර, මෙම රීති සම්බන්ධයෙන් හෝ මෙම රීතිවල කාර්ය සඳහා සද්භාවයෙන් සිදු කරන ලද හෝ සිදු කිරීම මගහරින ලද කිසිදු ක්‍රියාවක් සඳහා පුද්ගලිකව හෝ අන්‍යාකාරයකින් වගකියනු නොලැබිය යුතුය.

13.4 මෙම රීති මගින් විධිවිධාන සලස්වා නොමැති CDS ආයතනයට අදාල හෝ ඒ හා සම්බන්ධිතව උපචිතවන යම් කරුණක් සම්බන්ධයෙන් වන විට, එම කරුණ තීරණය කිරීමේ අයිතිය CDS සතු වේ. මෙම රීතිය ප්‍රකාරව CDS විසින් ලබා දෙන යම් තීරණයක් සමගින් සියලු පාර්ශව බැඳී සිටිය යුතුය.

## 13.5 මෙම රීති සංශෝධනය කිරීම

SEC හි අනුමැතියට යටත්ව, CDS විසින් මෙම රීතිවල සඳහන් විධිවිධාන කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකිය. එම සංශෝධන වහාම බලාත්මක වන පරිදි හෝ අන්‍යාකාරයකින් CDS විසින් තීරණය කරනු ලබන ආකාරයට සාදනු ලැබිය හැකිය. CDS විසින් එම සංශෝධන පිළිබඳව සහභාගිකරුවන් වෙත ලිඛිතව නිවේදනය කරනු ලැබිය යුතුය.

## 13.6 ආකෘති පත්‍ර

මෙම රීති ප්‍රකාරව CDS පහසුකම් ක්‍රියාත්මක කිරීමට අදාලව CDS විසින් නිකුත් කරනු ලබන සහ/හෝ නියම කරනු ලබන සෑම ආකෘති පත්‍රයක්ම සහ වෙනත් ලේඛන, CDS හි පරම අභිමතය පරිදි ඒවාට යමක් එකතු කිරීම, ඉවත් කිරීම, බැහැර කිරීම මගින් කලින් කල සංශෝධනය කරනු ලැබිය හැකිය.

## 13.7 CDS වෙත ගෙවිය යුතු සේවා ගාස්තු

CDS විසින් සපයනු ලබන සේවා සඳහා CDS විසින් ගිණුම් හිමියන්ගෙන්, ලැයිස්තුගත ආයතනවලින් සහභාගිකරුවන්ගෙන් හෝ වෙනත් පාර්ශවයන්ගෙන් CDS විසින් තීරණය කරනු ලබන ආකාරයට කලින් කල ගාස්තු අයකරනු ලැබිය හැකිය.

ගාස්තු සම්බන්ධයෙන් වන යම් වෙනස් වීම් චක්‍රලේඛ ආකාරයෙන් CDS විසින් සහභාගිකරුවන් වෙත නිවේදනය කරනු ලැබිය යුතුය.

## 13.8 CDS පරිශ්‍ර වෙත ඇතුල්වීම

කළමනාකාරවරයාගේ හෝ ඔහු නොමැති නම් ඔහු වෙනුවෙන් ක්‍රියාකිරීම සඳහා නම් කර ඇති තැනැත්තාගේ පූර්ව ලිඛිත අවසරය නොමැතිව CDS පරිශ්‍රය වෙත ඇතුල්වීම සඳහා කිසිදු තැනැත්තකු වෙත අවසර දෙනු නොලැබේ.

## 14 වන කොටස

**සහභාගිකරුවන්ගේ මූල්‍ය වගකීම සහ මෙහෙයුම් හැකියාව**

14.1 CDS විසින් අවශ්‍ය සහ උචිත බවට සලකන ආකාරයට සහභාගිකරුවන්ගේ මූල්‍ය වගකීම, මෙහෙයුම් හැකියාව, අත්දැකීම් සහ කුසලතාවය පිළිබඳ ප්‍රමිතීන් සකස්කරනු ලැබිය හැකිය. සහභාගිකරුවන් වශයෙන් පිළිගෙන ඇති සහභාගිකරුවන් සඳහාද CDS විසින් මාර්ගෝපදේශ සකස් කරනු ලැබිය හැකිය. සහභාගිකරුවකු වීම සඳහා යම් සහභාගිකරුවකුගේ හෝ ඉල්ලුම්කරුවකුගේ මූල්‍ය වගකීම සහ මෙහෙයුම් කුසලතාවය පිළිබඳ විභාගකිරීමේ බලය CDS සතු වේ. එවැනි විභාගකිරීම් පැවැත්වීමේදී, සහභාගිකරුගේ හෝ ඉල්ලුම්කරුගේ මූල්‍ය වගකීම සහ මෙහෙයුම් කුසලතාවය ප්‍රදර්ශනය කිරීම සඳහා CDS හි මතය අනුව ප්‍රමාණවත්වන තොරතුරු සපයන ලෙස, පොත් සහ වාර්තා ඉදිරිපත් කරන ලෙස සහ දිව්රන ලද හෝ දිව්රුම් නොදුන් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස CDS විසින් යම් සහභාගිකරුවකු වෙත හෝ ඉල්ලුම්කරුවකු වෙත නියම කරනු ලැබිය හැකිය.

14.2 ඇතුලත් කර ගැනීමෙන් පසුව, සහභාගිකරුවන් විසින් සෑම එක් එක් කාර්තුව අවසානයේ සිට දින විස්සක් (20) අවසන්වීමට පෙරාතුව CDS වෙත මූල්‍ය ප්‍රකාශ භාරදිය යුතු අතර මූල්‍ය වර්ෂය අවසානයේ සිට මාස හයක (06) කාලයක් ඇතුලත විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ භාරදිය යුතු වේ. නියමිත දිනයේදී හෝ එම දිනයට පෙරාතුව එකී ප්‍රකාශ භාරදීමට අපොහොසත් වුවහොත්, එම වාර්තා ගොනුකරනු ලබන තෙක් සහභාගිකරුවන් අත්හිටවනු ලැබේ.

14.3 යම් සහභාගිකරුවකු මූල්‍යමය වශයෙන් අස්ථාවර බවට අනාවරණය වුවහොත් CDS විසින් පිරිනමනු ලබන සේවා සහ පහසුකම් භාවිත කිරීමෙන් යම් සහභාගිකරුවකු අත්හිටුවීමේ අයිතිය CDS හි අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

14.4 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් කාලසීමාවක් සඳහා අඛණ්ඩව CDS සමග ක්‍රියාකාරී ලෙස ව්‍යාපාර කටයුතු සිදු කර නොමැති යම් සහභාගිකරුවකුගේ සහභාගිකාර තත්ත්වය CDS විසින් අපක්‍රමණය කරනු ලැබේ.

## 15 වන කොටස

**සේවා සඳහා ප්‍රවේශ වීමේ සීමාවන්**

CDS හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ එම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරනු ලබන යම් කමිටුවක් විසින් පහත දැක්වෙන හේතු අනුව CDS විසින් පිරිනමනු ලබන සේවා වෙත ප්‍රවේශවීම යම් සහභාගිකරුවකු වෙත අත්හිටුවීම හෝ තහනම් කිරීම හෝ සීමා කිරීම කරනු ලැබිය හැකිය.

(ඒ) එම සහභාගිකරු යම් නියාමන හෝ ස්වයං - නියාමන සංවිධානයකින් ඉවත්කර හෝ අත්හිටුවීමට යටත්කර දැනට එසේ යටත්ව ඇත්නම්; හෝ

(බී) එම සහභාගිකරු අදාල අරමුදල් භාරදීම හෝ සුරැකුම්පත් භාරදීම පැහැරහැර ඇත්නම් ; හෝ

(සී) එම සහභාගිකරුගේ මූල්‍ය හෝ මෙහෙයුම් අපහසුතාවය හේතුවෙන් CDS සහභාගිකරුවන්, බැරකරුවන් හෝ ආයෝජකයන් ආරක්ෂා කර ගැනීම සඳහා එම ක්‍රියාමාර්ග අවශ්‍ය බවට CDS විසින් ස්වකීය අභිමතය පරිදි තීරණය කරනු ලබන්නේ නම්.

## 16 වන කොටස

### විනය පිළිබඳ කාර්ය පටිපාටි

### 16.1 විනයානුකූල කාර්ය පටිපාටි

(ඒ) CDS රීති හෝ කාර්ය පටිපාටි උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් හෝ, CDS සමග එම සහභාගිකරුවන්ගේ ගිවිසුම් උල්ලංඝණය කිරීම පිළිබඳව හෝ CDS ක්‍රියාකාරීත්වයට අහිතකර වන යම් වැරැද්දක්, ප්‍රමාදයක් හෝ වෙනත් විෂමාචාරයක් සඳහා හෝ එම සහභාගිකරුගේ CDS ට අදාල ව්‍යාපාර කටයුතු සඳහා ප්‍රමාණවත් පහසුකම් සැපයීමක් සිදු නොවීම හේතුවෙන් CDS විසින් එම සහභාගිකරු නෙරපීම, අත්හිටුවීම, කාර්ය, කර්තව්‍ය සහ මෙහෙයුම් කටයුතු අත්හිටුවීම, සීමා කිරීම, දඩ පැනවීම හෝ අවශ්‍ය බවට සලකන වෙනත් දණ්ඩනයක් මගින් CDS විසින් විනයානුකූලව ක්‍රියාකරනු ලැබිය හැකි නමුත් එක් තනි වරදක් සඳහා එම දඩ මුදල රු.5,000,000/- නොඉක්මවිය යුතුය.

(බී) මෙම රීතියට අනුව යම් සහභාගිකරුවකු සඳහා විනයානුකූල සම්බාධකයක් පැනවීමට පෙරාතුව, සහභාගිකරුට එරෙහිව පවතින චෝදනාව පිළිබඳව සහ එම චෝදනාව විභාග කිරීමේ CDS හි අයිතිය පිළිබඳව CDS විසින් එම සහභාගිකරු වෙත නිවේදනය කරනු ලැබිය යුතුය. එම තීරණය දැනුම් දීමෙන් පසුව දින දාහතරක කාලසීමාවක් ඇතුලත එම තීරණයෙන් අතෘප්තියට පත්වන යම් සහභාගිකරුවකු විසින් සංශෝධිත 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පනතේ 46 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව වෙත අභියාචනය කිරීම සඳහා අයිතියක් තිබිය යුත්තේය.

### 16.2 රීති උල්ලංඝණය කිරීම හෝ රීතිවලට එකඟව ක්‍රියාකිරීම පැහැර හැරීම සඳහා වූ දඩ මුදල්

ලැයිස්තුගත ආයතන විසින් මෙම රීති උල්ලංඝණය කිරීම හෝ මෙම රීතිවලට එකඟව ක්‍රියාකිරීම උල්ලංඝණය කිරීම පිළිබඳව CDS විසින් දඩ මුදල් පනවනු ලැබිය හැකිය. එම දඩ මුදල් ප්‍රමාණය CDS අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින්කල නිශ්චය කරනු ලැබිය හැකිය.

## 17 වන කොටස

**කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව (CSE) වෙත (සංශෝධිත) සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 23 වන වගන්තිය ප්‍රකාරව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (SEC) විසින් ලබාදෙන විධානයකින් පසුව අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය පිළිබඳ රීති.**

17.1 වෙනත් කොටස් තැරැව්කාර / කොටස් වෙළඳ සහභාගිකරුවන්ගේ සුරැකුම්පත් ගණුදෙනුවලට අදාල හිඟ ගිවිසුම් භාර ගැනීම සඳහා කොටස් තැරැව්කරුවකු / කොටස් වෙළඳ සහභාගිකරුවකු පිළියෙල කර ගැනීම සඳහා සංශෝධිත 1987 අංක 36 දරන SEC පනතේ 23 වන වගන්තිය ප්‍රකාරව SEC විසින් CSE වෙත නියම කර ඇති අවස්ථාවකදී, CSE විසින් එසේ ක්‍රියාකිරීමට නියම කිරීමෙන් පසුව CDS විසින් පහත දැක්වෙන කාර්ය පටිපාටිය අනුගමනය කරනු ලැබිය හැකිය.

17.2 කොටස් තැරැව්කාර / කොටස් වෙළඳ සහභාගිකරුවකුගේ ගෙවීම් පැහැර හැරීම පිළිබඳව, SEC විසින් නිකුත් කරනු ලබන විධානය පිළිබඳව, සහ එම කොටස් තැරැව්කරු/කොටස් වෙළඳ සහභාගිකරු හරහා ස්වකීය සුරැකුම්පත් පවත්වාගෙන යනු ලබන ගිණුම් හිමියන් විසින් ගනු ලැබිය යුතු පියවර පිළිබඳව දැනුම් දෙමින් CDS විසින් ප්‍රධාන භාෂා තුනෙන් පුවත්පත් දැන්වීමක් පළකරනු ලැබිය යුතුය.

17.3 ගෙවීම් පැහැර හැරීමේ කොටස් තැරැව්කාර / කොටස් වෙළඳ සහභාගිකරුවකු සමග සුරැකුම්පත් දරනු ලබන යම් ගිණුම් හිමියන් වෙත ඉහත 2 වන රීතියේ සඳහන් නිවේදනය පළවීමෙන් වෙළඳ දින 30 ක් ඇතුළත ස්වකීය තේරීම අනුව ස්වකීය කොටස් තැරැව්කරුගේ / කොටස් වෙළඳ සහභාගිකරුගේ සිට වෙනත් යම් සහභාගිකරුවකු වෙත මාරුවීමේ අවස්ථාව ලබා දෙන නමුත් අදාල සුරැකුම්පත් සම්බන්ධයෙන් කොටස් තැරැව්කරු / කොටස් වෙළඳ සහභාගිකරු වෙත කිසිදු බැඳීමක් සහ හිඟ මුදල් ගෙවීමක් නොතිබිය යුතු ය.

17.4 ගෙවීම් හිඟවනසේ හෝ බැඳීම් සහිතව සුරැකුම්පත් මිලදී ගෙන ඇති අවස්ථාවකදී, එම බැඳීම් යථාපරිදි නිරාකරණය කරනු ලැබුවහොත් සහ එසේ සිදු කිරීමේදී පමණක්, අධිකරණයක් විසින් පනවනු ලබන සීමා කිරීම්වලට යටත්ව වෙනත් විකල්ප කොටස් සහභාගිකරුවකු වෙත එම කොටස් පැවරීම සඳහා ගිණුම් හිමියා වෙත අවසර දෙනු ලැබේ.

17.5 නිවේදනය පළවී වෙළඳ දින තිහක් (30) ඇතුලත හිණුම් හිමියන් විසින් පවරා නොමැති සුරැකුම්පත් පිළිබඳ විස්තර අදාල කොටස් තැරැව්කාර / කොටස් වෙළඳ සහභාගිකරු වෙත CDS විසින් ලබා දිය යුතු අතර, එම සුරැකුම්පත් මාරු කරනු ලැබිය හැකිද යන්න පිළිබඳ තහවුරු කිරීමක් සහ එසේ සිදු නොවුවහොත්, ඒ පිළිබඳ හේතු සහ එම කොටස්වලට සම්බන්ධිත බැඳීම් පිළිබඳව වෙළඳ දින 7 ක් ඇතුලත ලබා දෙන ලෙස එම කොටස් තැරැව්කරුගෙන් / කොටස් වෙළඳ සහභාගිකරුගෙන් ඉල්ලා සිටිය හැකිය.

එම ඉල්ලීමට පසුව වෙළඳ දින 7 ක් ඇතුලත තොරතුරු ලැබී නොමැති අවස්ථාවකදී, කොටස් පවරනු ලැබිය හැකි බවටත්, එම කොටස්වලට සම්බන්ධිත බැඳීම් නොමැති බවටත් එසේ වුවද අධිකරණ නියමයක් මගින් පනවනු ලබන සීමා කිරීම්වලට එම කොටස් යටත්වන බවටත්, උපකල්පනය කරනු ලැබේ.

17.6 කොටස් තැරැව්කාර / කොටස් වෙළඳ සහභාගිකරු විසින් ලබාදෙන තොරතුරු මත පදනම්ව, කොටස් තැරැව්කරු / කොටස් වෙළඳ සහභාගිකරු විසින් ප්‍රකාශ කරනු ලබන පරිදි බැඳීමකට යටත් නොවන හෝ 5 වන රීතිය ප්‍රකාරව බැඳීමකට යටත් නොවන කොටස් සම්බන්ධයෙන් CDS විසින් පහත දැක්වෙන එක් පියවරක් ගනු ලැබිය හැකිය ;

(i) පහත දැක්වෙන ආකාරයට CDS විසින් පත්කරනු ලබන වෙනත් සහභාගිකරුවකු/ සහභාගිකරුවන් වෙත එම කොටස් පැවරීම සඳහා පියවර ගැනීම ආරම්භ කිරීම :-

(ඒ) කිසිදු කොන්දේසියකට යටත් නොවිය යුතු පරිදි ස්වකීය අරමුණ පැහැදිලි කරමින් එම ගෙවීම් පැහැර හැරීමේ කොටස් තැරැව්කාර / කොටස් වෙළඳ සහභාගිකරුගේ යටතේ ඇති හිණුම් අත්කර ගැනීම සඳහා කැමැත්තක් දක්වන සහභාගිකරුවන් විසින් CDS වෙත ලිඛිත ඉල්ලීමක් කිරීම;

(බී) (i) සහභාගිකරුවන් එක් තැනැත්තකුට වැඩි පිරිසක් විසින් එසේ කැමැත්ත පළකර ඇත්නම්, එම කැමැත්ත පළ කළ සහභාගිකරුවන් අතර ගෙවීම් හිඟ සුරැකුම්පත් හිණුම් බෙදා දීම කුමන පදනම මත සිදු කළ යුතු ද යන්න පිළිබඳව CDS විසින් තීරණය කරනු ලැබේ.

(ii) ගෙවීම් පැහැර හැරීමේ කොටස් තැරැව්කාර / කොටස් වෙළඳ සහභාගිකරුගේ සුරැකුම්පත් ගිණුම් අත්කර ගැනීම පිළිබඳ කිසිදු සහභාගිකරුවකු විසින් කැමැත්තක් ඉදිරිපත්කර නොමැති අවස්ථාවක දී, CDS විසින් :-

(ඒ) එම ගිණුම් අත්හිටුවීම ; හෝ

(බී) කොටස් තැරැව්කාර / කොටස් වෙළඳ සහභාගිකරු සමග තැන්පත්කර ඇති සුරැකුම්පත් දැරීමට අනුව පිළිවෙලින් වූ ගිණුම් හිමියන්ගේ නම්වලින් කොටස් සහතික පත්‍ර නිකුත් කිරීම සඳහා සහ එම සහතික පත්‍ර ගිණුම් හිමියා වෙත භාරදීම සඳහා අදාල ලැයිස්තුගත සමාගම් සමග කටයුතු සලස්වනු ලැබිය යුතුය.

17.7 5 වන රීතිය ප්‍රකාරව කොටස් තැරැව්කාර / කොටස් වෙළඳ සහභාගිකරු විසින් ප්‍රකාශයට පත්කර ඇති ආකාරයට බැඳීමට යටත්ව ඇති සුරැකුම්පත් CDS විසින් අත්හිටුවනු ලැබිය යුතු ය.

17.8 පසුව හිඟ මුදල් ගෙවනු ලබන සහ බැඳීම් ඉටුකරනු ලබන ගිණුම් හිමියන් විසින් කොටස් තැරැව්කාර /කොටස් වෙළඳ සහභාගිකරුවන් තත්කාර්ය සඳහා සහතිකයක් ලබාගෙන එම සුරැකුම්පත් වෙනත් කොටස් සහභාගිකරුවකු වෙත පැවරීම සඳහා ඉල්ලා සිටිනු ලැබිය හැකිය.

17.9 ඉහත කී කාර්ය පටිපාටිය අනුව ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසුවද අත්හිටුවා පවතින සුරැකුම්පත් SEC හි අනුමතිය සහිතව වෙනත් පාර්ශවයක් වෙත මාරු කරනු ලැබිය හැකිය.

## 18 වන කොටස

**ණය සුරැකුම්පත් වලට අදාල රීති**

18.1 **අර්ථනිරූපණය**

**ආයතන ණය සුරැකුම්පත්**

යන්නෙන් ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ණය සුරැකුම්පත්" අදහස් වේ.

**ණය සුරැකුම්පත්**

යන්නෙන් රජයේ කොටස් හා සංස්ථා ණය සුරැකුම්පත් අදහස් වේ.

**රජයේ සුරැකුම්පත් යන්නෙන්**

- (සංශෝධිත) 1923 අංක 8 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත ප්‍රකාරව නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත් ;
- (සංශෝධිත) 1937 අංක 7 දරන ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥා පනත ප්‍රකාරව නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර ;
- ජාතික රාජ්‍ය සභාවේ 1949 අංක 58 දරන මුදල් (සංශෝධන) පනත ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන යම් සුරැකුම්පත් ;

අදහස් වේ.

**සහභාගිකරු යන්නෙන්**

ණය සුරැකුම්පත් වෙළඳාම් කිරීම සඳහා CSE විසින් අවසර ලබා දී ඇති (අවස්ථාවෝචිත පරිදි) යම් කොටස් තැරැව්කාර සහභාගිකරුවකු හෝ කොටස් ගනුදෙනුකරුවකු අදහස් වේ.

**ගෙවා නිරාකරණය කිරීමේ දිනය යන්නෙන්**

- ටොම් බෝඩ් මත ගනුදෙනු කරන ලද ණය සුරැකුම්පත් සඳහා වූ වෙළඳ දිනයෙන් පසුව එළඹෙන පළමු වෙළඳ දිනය (T+1) ; සහ
- ස්පොට් බෝඩ් මත ගනුදෙනුකරන ලද ණය සුරැකුම්පත් සඳහා වූ වෙළඳ දිනයෙන් පසුව එළඹෙන දෙවන වෙළඳ දිනය ( T+2) ;

අදහස් වේ.

**ස්පොට් බෝඩ් (Spot Board)**

යන්නෙන් ගනුදෙනු සඳහා වූ ගෙවා නිරාකරණය කිරීමේ දිනය, වෙළඳ දිනයෙන් පසුව යෙදෙන දෙවන වෙළඳ දිනය ( T+2) වන අවස්ථාවකදී ගනුදෙනු කටයුතු ක්‍රියාත්මක කරනු ලබන වෙළඳ පුවරුව අදහස් වේ.

**ටොම් බෝඩ් (Tom Board)**

යන්නෙන් ගනුදෙනු සඳහා වූ ගෙවා නිරාකරණය කිරීමේ දිනය වෙළඳ දිනයෙන් පසුව යෙදෙන පළමු වෙළඳ දිනය ( T+1) වන අවස්ථාවකදී ගනුදෙනු කටයුතු ක්‍රියාත්මක කරනු ලබන වෙළඳ පුවරුව අදහස් වේ.

### 18.2 ණය සුරැකුම්පත් සඳහා වූ සඳහන් කිරීම

මෙම රීතිවල ණය සුරැකුම්පත් ගනුදෙනුකිරීම, නිශ්කාශනය සහ ගෙවා නිරාකරණය කිරීම සඳහා කරනු ලබන සෑම සඳහන් කිරීමක්ම, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස, එම ණය සුරැකුම්පත්වල අර්ථලාභී සම්බන්ධතාවය ගණුදෙනු කිරීම, නිශ්කාශනය කිරීම සහ ගෙවා නිරාකරණය කිරීමක් ලෙස අදහස් වේ.

### 18.3 ණය සුරැකුම්පත් ගෙවා නිරාකරණය කිරීම

CSE හි ස්වයංක්‍රීය වෙළඳ පද්ධතිය හරහා සිදු කරනු ලබන ගනුදෙනු කිරීමකින් පසුව, ණය සුරැකුම්පත් මිලදී ගැනීම්කරුගේ සේවාදායක ගිණුමට බැර කිරීම, එම නම් කර ගෙවා නිරාකරණය කිරීමේ බැංකුවෙන් ගෙවා නිරාකරණය කිරීමේ අරමුදල් ලැබීම තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් සිදු විය යුතු වේ.

### 18.4 අන්තර් සහභාගීත්ව ගෙවා නිරාකරණය කිරීම්

(ඒ) CSE මත වෙළඳාම් කරනු ලබන සුරැකුම්පත් සඳහා කරනු ලබන අන්තර් - සහභාගීත්ව අරමුදල් ගෙවා නිරාකරණය කිරීම, CDS විසින් නිකුත් කරනු ලබන ගෙවා නිරාකරණය කිරීමේ උපලේඛනවලට අනුව ගෙවා නිරාකරණය කිරීමේ බැංකුව/බැංකු හරහා ගෙවා නිරාකරණය කිරීමේ දිනය වශයෙන් එහි සඳහන් වන්නා වූ වෙළඳ දිනයේ 10.30 පැය වන විට සිදු කරනු ලැබිය යුතු ය. අන්තර් සහභාගීත්ව ගෙවා නිරාකරණය කිරීම් ගෙවා නිරාකරණය කිරීමේ දින 10.30 පැය වන විට සම්පූර්ණ කරනු ලැබිය යුතුය.

(ඕ) මෙම රීති ප්‍රකාරව ගෙවිය යුතු සහ ලැබිය යුතු මුදල් CDS විසින්ම සහ සහභාගිකරුවන් විසින් හරකිරීම හෝ බැර කිරීම සිදු කළ යුතු වේ.

(ඝ) සහභාගිකරුගේ ගිණුමට ඇතුලත් කර ඇත්තා වූ හර කිරීම් සහ බැර කිරීම් පෙන්නුම් කරනු ලබන සහ යම් නිශ්චිත ගෙවා නිම කිරීමේ දිනයක දී එක් එක් සහභාගිකරු විසින් ගෙවා නිරාකරණය කළ යුතු ශුද්ධ මුදල පෙන්නුම් කරනු ලබන ගෙවා නිරාකරණය කිරීමේ උපලේඛනයක් සෑම එක් එක් වෙළඳ දිනයකදීම CDS විසින් නිකුත්කරනු ලැබිය යුතු ය.

(ඞ) සුරැකුම්පත් මිලදී ගැනීම සඳහා ගෙවා නිරාකරණය කිරීමේ දිනයේ 09.00 පැය වන විට මිලදී ගැනීමේ කොටස් තැරැව්කාර සහභාගිකරු/භාරකාර බැංකුව වෙත " නිශ්කාශනය වූ අරමුදල්" පවතින බවට මිලදී ගන්නා විසින් සහතික විය යුතු ය.

(ඊ) CDS විසින් නිකුත් කරනු ලබන ගෙවා නිම කිරීමේ උපලේඛනය මත පදනම්ව එම සහභාගිකරු විසින් පවත්වාගෙන යනු ලබන ගනුදෙනු තුලින් උපචිත වන ගෙවීම් නිරාකරණය කිරීම සඳහා ගෙවා නිරාකරණය කිරීමේ දින 09.30 පැය වන විට ගෙවා නිම කිරීමේ බැංකු ගිණුමේ ප්‍රමාණවත් නිශ්කාශනය වූ අරමුදල් පවතින බවට කොටස් තැරැව්කාර සහභාගිකරු සහතික විය යුතු ය.

(එෆ්) CDS විසින් නිකුත් කරනු ලබන ගෙවා නිම කිරීමේ උපලේඛනය මත පදනම්ව භාරකාර බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන ගනුදෙනු තුලින් උපචිත වන ගෙවීම් නිරාකරණය කිරීම සඳහා ගෙවා නිරාකරණය කිරීමේ දිනයේ 09.30 පැය වන විට භාරකාර බැංකු විසින් ගෙවා නිරාකරණය කිරීමේ බැංකු වෙත ප්‍රමාණවත් නිශ්කාශනය වූ අරමුදල් තිබීමට කටයුතු සැලැස්විය යුතු ය.

මෙම රීතියේ "නිශ්කාශනය වූ අරමුදල්" යන්නෙන් නිශ්කාශනය වී ඇත්තාවූ ද පිළිවෙලින් වූ ගෙවා නිරාකරණය කිරීමේ බැංකුවේ ආපසු ලබා ගැනීම සඳහා පවතින අරමුදල් අදහස් වේ.

## 18.5 සුරැකුම්පත් කොටස් පිළිබඳ ගනුදෙනු සම්බන්ධයෙන් අදාලවන ආන්තික අවශ්‍යතා

(ඒ) අන්තර් කොටස් ගනුදෙනු නිරාකරණ්‍ය කිරීම් පවතිද්දී සහභාගිකරු විසින් සිදු කරනු ලබන ගනුදෙනුවලින් උපචිතවන අවදානම් නිරාකරණය කිරීම සැලකිල්ලට ගෙන, එක් එක් සහභාගිකරු සම්බන්ධයෙන් ස්පොට් බෝඩ් මත ක්‍රියාකරනු ලබන වෙළඳාම් කිරීමෙන් පසුව ආන්තික අවශ්‍යතාවය CDS විසින් ගණනය කරනු ලැබේ. එම ආන්තික අවශ්‍යතාවය CDS විසින් සහභාගිකරු වෙත වෙළඳ දිනය අවසානයේදී (T) දැනුම් දිය යුතුය.

(බී) ආන්තික අවශ්‍යතාවය කලින් කල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ක්‍රමවේදයක් ප්‍රකාරව ගණනය කරනු ලැබි යුතු ය.

(සී) එම සහභාගිකරු විසින් යම් වෙළඳ දිනයකදී ස්පොට් බෝඩ් මත සිදුකරනු ලබන සම්පූර්ණ මිලදී ගැනීම් ප්‍රමාණය රුපියල් මිලියන දහයකට (10) සමාන වන හෝ එම මුදල් ඉක්මවන අවස්ථාවක දී යම් සහභාගිකරුවකු සම්බන්ධයෙන් ආන්තික අවශ්‍යතාවය අදාල කර ගනු ලැබිය යුතුය.

(ඩී) ටොම් බෝඩ්හි සිදුකරනු ලබන වෙළඳාම් සඳහා ආන්තික අවශ්‍යතාවය ගණනය කරනු නොලැබේ.

## 18.6 CDS වෙත ඇපකර ලබා දීම

(ඒ) ඉහත 18.5 (සී) රීතියේ දක්වා ඇති පරිදි ආන්තික අවශ්‍යතාවක් අදාල වන අවස්ථාවකදී, සහභාගිකරු විසින් වෙළඳ දිනය + 1 (T+1) වන දින 9.30 පැය වන විට ඇපකරයක් සැපයිය යුතු වේ. CDS වෙත ඉදිරිපත් කරනු ලබන ඇපකරයේ වටිනාකම ඉහත 18.5 රීතිය ප්‍රකාරව ගණනය කරනු ලබන එකී සහභාගිකරුගේ ආන්තික අවශ්‍යතාවයට අවම වශයෙන් සමාන විය යුතුය.

(බී) CDS වෙත සපයනු ලබන ඇපකරය මුදල් තැන්පතුවක් සහ/හෝ අවහිර කරන ලද ගිණුමක තැන්පත් කරන ලද රජයේ සුරැකුම්පත් වශයෙන් තිබිය යුතුය.

මෙම රීතියේ කාර්ය සඳහා "අවහිර කරන ලද ගිණුම" යන්නෙන් වෙළඳාම් කිරීම අත්හිටුවා ඇති CDS සමග පවත්වාගෙන යනු ලබන සහභාගිකරුගේ නම් කළ ගිණුමක් අදහස් වේ.

(සී) පහත සඳහන් ගෙවීම් පියවීම සඳහා CDS විසින් ඇපකරය භාවිත කරනු ලැබිය යුතු ය :-

(i) යම් ගෙවීම් පැහැර හැරීමේ සහභාගිකරුවකු විසින් එම සහභාගිකරුගේ යම් සේවාදායකයකු වෙත ලබා දිය යුතු සහ ගෙවිය යුතු යම් මුදල් පියවීම සඳහා ; සහ/හෝ

(ii) එම සහභාගිකරු විසින් CDS හි වෙනත් සහභාගිකරුවකු වෙත ලබා දිය යුතු සහ ගෙවිය යුතු මුදල් පියවීම සඳහා; සහ/හෝ

(iii) එම සහභාගිකරු විසින් CDS, CSE සහ SEC වෙත ගෙවිය යුතු ගාස්තු, කොමිස් මුදල්, අය කිරීම් සහ හිඟ මුදල් පියවීම සඳහා.

(ඩී) ඉහත 18.6 (බී) වගන්තියේ සඳහන් රජයේ සුරැකුම්පත් වෙළඳාම් කරනු නොලැබිය යුතු ය. එම රජයේ සුරැකුම්පත් එක් එක් වෙළඳ දිනයේදී වෙළඳාම් කිරීම අවසානයේදී සහ අවහිර කරන ලද ගිණුම සඳහා සහ/හෝ එම ගිණුමෙන් පැවරීම් කිරීමේ දී වෙළඳපළ වෙත වාර්තා කරනු ලැබිය යුතු ය. අවහිර කරන ලද ගිණුමේ දරනු ලබන එම රජයේ සුරැකුම්පත්වල වටිනාකම තීරණය කිරීමේ දී, රජයේ සුරැකුම්පත්වල වෙළඳපල වෙත වාර්තා කිරීමේ වෙළඳ අගය සලකා බලනු ලැබිය යුතු වේ.

(ඊ) අවහිර කරන ලද ගිණුමේ සිට CDS හි සහභාගිකරුගේ වෙළඳාම් කිරීමේ ගිණුම වෙත රජයේ සුරැකුම්පත් මාරු කිරීම, සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන පරිදි එම සහභාගිකරු විසින් සපයනු ලබන මුදල් තැන්පතුව සහ/හෝ රජයේ සුරැකුම්පත් වටිනාකම නියමිත මට්ටමට වැඩි වන අවස්ථාවකදී පමණක් අවසර දෙනු ලැබේ.

(එෆ්) ස්වකීය ආන්තික අවශ්‍යතාවය සපුරාලීම සඳහා සහභාගිකරු විසින් නියමිත ඇපකරය ලබා දීමට අපොහොසත් වන අවස්ථාවක දී, එම සහභාගිකරු විසින් ණය සුරැකුම්පත් මත වෙළඳාම් කිරීම අත්හිටුවනු ලැබිය යුතුය.

## 18.7 භාරකාර බැංකුවක් හරහා සිදු කරනු ලබන වෙළඳාම් කිරීම් ගෙවා නිරාකරණය කිරීමේ වගකීම

භාරකාර බැංකුවක් හරහා ලියාපදිංචි ගිණුම් හිමියකු වෙනුවෙන් සිදු කරනු ලබන ණය සුරැකුම්පත් ගනුදෙනු කිරීමක් සඳහා අදාල භාරකාර බැංකුව විසින් ගෙවා නිරාකරණය කිරීම් සිදු නොකරන අවස්ථාවකදී, එම වෙළඳාමේ ගෙවා නිරාකරණය කිරීමේ වගකීම, එම වෙළඳාම සිදු කළ කොටස් තැරැව්කාර සහභාගිකරු වෙත පැවරෙනු ඇත.

## 18.8 සංස්ථා ණය සුරැකුම්පත් පිළිබඳ පොළිය සහ කල්පිරීමේ ප්‍රතිශ්ඨා අරමුදල්

(ඒ) හිමිකම් ලැබීමේ දිනය වන විට සංස්ථා ණය සුරැකුම්පත් වලට අදාල ස්වකීය පිළිවෙලින් වූ සුරැකුම්පත් දැරීමක් සහිත ගිණුම් හිමියන්ගේ ලැයිස්තුවක් සමාගම් ලේකම්වරයා වෙත CDS විසින් සපයනු ලැබිය යුතුය.

(බී) පොළිය සහ කල්පිරීමේ ප්‍රතිශ්ඨා මුදල් CDS විසින් සපයනු ලබන තොරතුරුවලට අනුව ගිණුම් හිමියා වෙත සෘජුවම ලබා දිය යුතු වේ.

## 18.9 රජයේ සුරැකුම්පත් පිළිබඳ පොළිය සහ කල්පිරීමේ ප්‍රතිශ්ඨා මුදල්

(ඒ) රජයේ සුරැකුම්පත්වල පොළිය සහ කල්පිරීමේ ප්‍රතිෂ්ඨා මුදල් CDS විසින් සහභාගිකරුරුවන් වෙත ගෙවිය යුතු ය.

(බී) රජයේ සුරැකුම්පත්වල පොළිය / කල්පිරීමේ ප්‍රතිශ්ඨා මුදල් ලබා ගැනීම සඳහා හිමිකම් සහිත ගිණුම් හිමියන්ගේ ලැයිස්තුවක් CDS විසින් එම සහභාගිකරුවන් වෙත ලබා දිය යුතු වේ.

(සී) CDS විසින් සපයනු ලබන තොරතුරු වලට අනුව සහභාගිකරුවන් විසින් ලබා ගන්නා පොළිය / කල්පිරීමේ ප්‍රතිශ්ඨා මුදල් ගිණුම් හිමියන් වෙත යථාපරිදි ගෙවනු ලබන බවට සහභාගිකරුවන් සහතික විය යුතුය.

(ඩී) පොළිය / කල් පිරීමේ ප්‍රතිශ්ඨා මුදල් ගෙවීමේ නියමිත දිනය වෙළඳ දිනයක් නොවන දිනයක යෙදී ඇති අවස්ථාවකදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරනු ලබන පරිචයන්ට අනුව CDS විසින් එම පොළිය /කල් පිරීමේ ප්‍රතිශ්ඨා මුදල් සහභාගිකරුවන් වෙත ගෙවනු ලැබිය යුතු වේ.

## 18.10 රජයේ සුරැකුම්පත් තැන්පත් කිරීම

(ඒ) ගිණුම් හිමියන් විසින් දරනු ලබන රජයේ සුරැකුම්පත් අයිතිය සහභාගිකරුවකු හරහා CDS වෙත පවරනු ලැබිය හැකිය. එම පැවරීමෙන් පසුව, රජයේ සුරැකුම්පත් CDS විසින් අදාල සේවා දායක ගිණුම්වල තැන්පත් කරනු ලැබිය යුතුය.

(බී) එම රජයේ සුරැකුම්පත්වල අර්ථලාභී සම්බන්ධතාවයන් අනාගතයේදී වෙළඳාම් කිරීමට යටත්ව, ගිණුම් හිමියා විසින් අර්ථලාභී සම්බන්ධතාවය තබා ගනු ලැබිය හැකිය.

(සී) CDS සමඟ රජයේ වලංගු නොවන සුරැකුම්පත් තැන්පත් කිරීම මගින් උපචිතවන සියලු වගකීම් සහභාගිකරු විසින් දරනු ලැබිය යුතුය.

## 19 වන කොටස

**CSE හි ස්වයංක්‍රීය වෙළඳ ක්‍රමය මත All or None AON blocks වශයෙන් සිදු කරනු ලබන වෙළඳාම් නිෂ්කාශනය කිරීම සහ මුදල් ගෙවා නිරාකරණය කිරීම සඳහා වූ අතිරේක රීති.**

19.1 **AON Block ක්‍රියාත්මක කිරීමෙන් පසු ගැණුම්කරුගේ/ගැණුම්කරුවන්ගේ ගිණුම්වලට කොටස් පැවරීම;**

(ඒ) AON Block එකක් ක්‍රියාත්මක කිරීමෙන් පසු, එම වෙළඳාම සඳහා මුදල් ගෙවා නිරාකරණය කරන තුරු වෙළඳාම් කරන දිනයේදී **CDS** හි ගැණුම්කරුගේ/ගැණුම්කරුවන්ගේ ගිණුම් තුල අවහිරකරන ලද ශේෂයට කොටස් පවරනු ලැබේ. T+3 දිනයේදී ගණුදෙනුව සඳහා මුදල් නිරාකරණය කිරීමෙන් පසු ගැණුම්කරුගේ/ගැණුම්කරුවන්ගේ අවහිර කර ඇති ශේෂයේ සිට එම ගැණුම්කරුගේ/ගැණුම්කරුවන්ගේ නිදහස් ශේෂයට එකී කොටස් පවරනු ලැබේ.

(බී) මුදල් නිරාකරණය කිරීම අසාර්ථක වී ඇති බවට CSE විමසා **CDS** විසින් තීරණය කරනු ලබන විට SEC හි අනුමතියට යටත්ව CDS විසින් ගැණුම්කරුගේ/ගැණුම්කරුවන්ගේ අවහිර කර ඇති ශේෂයේ සිට **CDS** හි පවත්වාගෙන යනු ලබන විකුණුම්කරුගේ/විකුණුම්කරුවන්ගේ ගිණුමට එම කොටස් පවරනු ලැබේ.

19.2 **ආයෝජකයන් සමුහයක් විසින් සිදු කරනු ලබන වෙළඳාම් සඳහා නම්කල ගිණුම**

ආයෝජකයන් සමුහයක් විසින් AON ගණුදෙනු සිදු කිරීමේ කාර්යය සඳහා භාවිත කිරීමට සහභාගිවන්නෙකු විසින් විශේෂ CDS ගිණුමක් විවෘත කළ යුතු අතර එම සමූහය ආයෝජකයන් දස (10) දෙනෙකුට නොවැඩි විය යුතු ය.

එම විශේෂ CDS ගිණුම භාරකාර බැංකුවක් හරහා විවෘත කරනු ලැබුවහොත් එම විශේෂ CDS ගිණුමෙන් පැන නගින සියලුම මුදල් නිරාකරණය කිරීමේ වගකීම් එම භාරකාර බැංකුව පිළිගන්නා බවට භාරකාර බැංකුව විසින් CDS මගින් කලින් කලට නිකුත් කරනු ලබන ආකෘතියට අනුව CDS හට පොරොන්දුවක් ලබාදිය යුතු ය.

19.3 සමුහයක් ලෙස කොටස් විකිණීමට ඇති පහසුකම ශ්‍රී ලංකා රජයට අයත් ආයතන/නියෝජ්‍ය ආයතනවලට පමණක් ලබාදිය යුතු ය. සමුහයක් වශයෙන් කොටස් මිලදී ගැනිමේ පහසුකම සියළු ආයෝජකයන්ට ලබා දිය යුතු ය.

19.4 **AON ගණුදෙනු පහසුකම භාවිත කරමින් ආයෝජකයන් සමුහයක් විසින් සිදු කරනු ලබන වෙළඳාම්වලට අදාළ කොටස් පැවරීම්;**

(ඒ) **ATS** රීතිවල සඳහන් පරිදි AON Block එකකට අදාළව සහභාගිකරුවකු හරහා විවෘත කරන ලද විශේෂ CDS ගිණුමක් භාවිත කරමින් ආයෝජකයන් සමුහයක් විසින් ඇණවුමක් තබා එම විශේෂ CDS ගිණුම හරහා AON Block මිලදී ගත් විට, **CDS** විසින් එම කොටස් ඉහත 19.1 රීතිය ප්‍රකාරව පවරනු ලැබිය යුතු ය.

(බී) ශ්‍රී ලංකා රජය බහුවිධ ආයතන/නියෝජ්‍යායතන හරහා ලැයිස්තුගත ආයතනයක කොටස් දරන අවස්ථාවක, සහභාගිකරුවෙකු හරහා ATS මත AON Block පහසුකම භාවිත කරමින් සමුහයක් ලෙස තනි විකුණුම් ඇණවුමක් ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා රජය අදහස් කරන අවස්ථාවක එම ආයතන/නියෝජ්‍යායතන සිය CDS ගිණුම්තුල දරා සිටින කොටස් පළමුවෙන් මෙම කාර්ය සඳහා සහභාගිකරුවෙකු විසින් විවෘත කරන ලද විශේෂ CDS ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

19.5 **අරමුදල් ගෙවා නිරාකරණය කිරීම සඳහා පහසුකම් සැලස්වීම**

(ඒ) වෙළඳාම් අවසන් කිරීමෙන් පසු AON Block පහසුකම භාවිත කරමින් සිදු කරන ලද වෙළඳාම් ඇතුළත් වන නිරාකරණය කිරීමේ උපලේඛන CDS විසින් ගැණුම්කරුගේ/ගැණුම්කරුවන්ගේ සහභාගිකරුට නිකුත් කළ යුතු ය. මෙම රීතිවල 6 වන කොටස ප්‍රකාරව අරමුදල් නිරාකරණය කිරීම සඳහා එම සහභාගිකරුවා වගකිව යුතු ය.

(බී) විශේෂ CDS ගිණුමක් හරහා ක්‍රියාත්මක වන ආයෝජකයන් සමුහයක් විසින් AON Block එකක් මිලදී ගනු ලැබුවහොත් එම AON ගණුදෙනුව සඳහා වු මුදල් නිරාකරණය කිරීමේ වගකීම තමන් හරහා විශේෂ CDS ගිණුම විවෘත කරනු ලැබු සහභාගිකරු විසින් දැරිය යුතුය. ගෙවා නිරාකරණය කිරීමේ දිනයේදී අදාළ ගණුදෙනුව නිරාකරණය කිරීම සඳහා නිෂ්කාශනය කරන ලද අරමුදල් ලබාදීමට කටයුතු සලස්වන ලෙස විශේෂ CDS ගිණුම භාවිත කරනු ලබන්නේ යම් ආයෝජකයන්ගේ ප්‍රතිලාභය උදෙසාද එම ආයෝජකයන් වෙත සහභාගිකරු උපදෙස් දිය යුතු ය.

(සී) AON Block පහසුකම භාවිත කරමින් බහුවිධ - ආයතන/නියෝජ්‍යායතන හරහා ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබන සුරැකුම්පත් මත විකිණීමේ වෙළඳාමක් ක්‍රියාත්මක කරනු ලබන්නේ නම්, ඉහත 19.4(බී) රීතිය ප්‍රකාරව විශේෂ CDS ගිණුමක් විවෘත කරනු ලැබුවේ යම් සහභාගිකරුවෙකු හරහාද එම සහභාගිකරු වෙත විකිණුම් ප්‍රතිශ්‍යා මුදල් පවරනු ලැබිය යුතුය. විකිණුම් ප්‍රතිශ්‍යා මුදල් ගෙවා නිරාකරණය කිරීමේ දිනයේදී අදාළ ආයතනයන්ට/නියෝජ්‍යායතනයන්ට පැවරීමට අදාළ සහභාගිකරු වගබලාගත යුතුය.

19.6 **රීතිය අත්හැරීම සහ/හෝ අතිරේක කොන්දේසි හඳුන්වාදීම**;

මෙහි සඳහන් කවර හෝ රීතියක් සහ/හෝ අතිරේක කොන්දේසියක්, ශ්‍රී ලංකා රජයට හිමි කොටස් AON Block පහසුකම් හරහා විකිණීමේ දී අදාළ වන්නේද සහ/හෝ හඳුන්වා දෙන්නේද යන්න SEC විමසා තීරණය කිරීමට CDS ට හැකිය.